# 3

# ආර්ථික හා සමාජ යටිතල පහසුකම්

දේශීය හා ගෝලීය වශයෙන් කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම මගින් රටේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වලට අදාළ සේවා සැපයුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් කෙරෙහි සැලකිය යුතු අවහිරතාවක් ඇති විය. 2020 මාර්තු මැද භාගයේ සිට මැයි මාසයේ මැද දක්වා දීප ව්‍යාප්තව පනවා තිබූ සංචරණ සීමා හේතුවෙන් දේශීය ප්‍රවාහන ක්‍රියාකාරකම් දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර, මාර්තු මාසයේ මැද සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සංචාරක පැමිණීම් සඳහා වසා තැබුණි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සමාජ ආර්ථික කටයුතු සීමා කිරීමට ලොව පුරා රටවල් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග සමඟ ගෝලීය සැපයුම් දාමවලට සිදු වූ බාධාවන් හේතුවෙන් වරාය අංශය ද බලපෑමට ලක් විය.  ප්‍රවාහන හා වරාය අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම වරාය නගර ව්‍යාපෘතිය ද ඇතුළුව නිවාස හා නාගරික සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාළ ක්‍රියාකාරකම් මෙම ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තිබූ කාල සීමාව තුළ දී අකර්මණ්‍යව පැවතුණි. දිවයින පුරා ක්‍රියාත්මක වූ සංචරණ සීමා මැයි මාසයේ දී ඉවත් කිරීමත් සමඟ ඉදිකිරීම් කටයුතු යථා තත්ත්වයට පත් වූ අතර, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ක්‍රියාකාරකම් නැවත ආරම්භ කෙරුණි. සමාජ ආර්ථික කටයුතු සීමා කර තැබීමට ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 පළමු භාගය තුළ දී බලශක්ති සඳහා වූ ඉල්ලුම පහළ ගිය ද, තුන්වන කාර්තුව සඳහා දැනට පවතින දත්ත මගින්, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමට අනුකූලව බලශක්ති සඳහා වන ඉල්ලුමෙහි ඉහළ යෑමක් පෙන්නුම් කෙරේ. ධනාත්මක වර්ධනයන් පිළිබඳව සලකා බැලීමේ දී, විදුලි සංදේශ අංශය කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් ඇති කළ අභියෝග සඳහා පූර්වෝපායිකව හැඩ ගැසුණු අතර, අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම් සුමටව හා අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වන සේ තරගකාරී මිල ගණන් යටතේ නව්‍ය පැකේජ සපයමින් සංචරණ සීමා යොදා තිබූ කාලපරිච්ඡේදය තුළ දී සීමා රහිතව අතත්‍ය සම්බන්ධතාව (Virtual connectivity) පවත්වා ගැනීම සහතික කිරීම සඳහා විදුලි සංදේශ පහසුකම් සපයන්නෝ ප්‍රයත්න දැරූහ. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ වුව ද පහසුවෙන් අවදානමට ලක් විය හැකි ජන කොටස් පිළිබඳ විශේෂ අවධානයකින් යුතුව සමාජ යටිතල පහසුකම් සැපයීම සඳහා රජය අඛණ්ඩව කැප විය. කොවිඩ්-19 වසංගතයේ ශීඝ්‍ර ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය අනෙකුත් පාර්ශ්වකරුවන් ගණනාවක් සමඟ අඛණ්ඩව සහයෝගීතාවයෙන් යුතු ව කටයුතු කළ අතර, ආසාදිතයන්ගේ ශීඝ්‍ර වැඩිවීමක් සිදු වුවහොත් ඒ සඳහා පෙර සූදානමක් ලෙස පූර්වෝපායිකව අදාළ පහසුකම් පුළුල් කරන ලදී. අදාළ සියලුම අංශ විසින් ගනු ලැබූ කාර්යක්ෂම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, වාර්තා වූ මරණ අනුපාතය පහළ අගයක් ගත්තේය. කෙසේ වෙතත්, මෑත දී වාර්තා වූ නව කොවිඩ්-19 ආසාදිත පොකුරු මගින් කොවිඩ්-19 ව්‍යාප්තියෙහි අවදානම දිගින් දිගටම පවතින බව පෙන්නුම් කරයි. නව පොකුරු බිහිවීමේ හැකියාව පිළිබඳව දිගින් දිගටම පරීක්ෂාකාරී වීම සහ රෝග වළක්වා ගැනීමේ දැඩි ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම මින් පැහැදිලි වේ. පාසල්, විශ්ව විද්‍යාල සහ පෞද්ගලික උපකාරක පන්ති වරින් වර වසා තැබුව ද, වැඩි වශයෙන් විද්‍යුත් මාධ්‍ය හරහා අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මේ අතර, දිවයින පුරා ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාලපරිච්ඡේදය තුළ දී ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සීමා සහිත වීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්,  අවදානමට ලක් විය හැකි පවුල් සහ පුද්ගලයින්ට ඔවුන්ගේ දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා හැකියාව ලබා දෙමින් රජය විසින් අප්‍රේල් හා මැයි යන මාස දෙක තුළ දී දීමනාවක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ආර්ථිකය මන්දගාමී වීම දිගු කාලයක් පැවතුණහොත් ජනගහනයේ මෙම කාණ්ඩ දුගී බවේ රේඛාවට වඩා පහළට වැටීමේ සම්භාවිතාව අධිකය. ආර්ථික හා සාමාජීය යටිතල පහසුකම් සාධාරණ ආකාරයට සැපයීම තුළින් සමාජයේ පවත්නා අනාරක්ෂිතභාවයන් සහ විෂමතා සඳහා විසඳුම් යෙදිය හැකි අතර, සෞභාග්‍යයේ ප්‍රතිලාභ සමානව බෙදී යෑම සහතික කළ හැකි තිරසාර සහ සර්ව සහභාගිත්ව වර්ධනයක් ඇති කිරීම සඳහා මග පෑදෙනු ඇත.

3


## ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

### ඛනිජ තෙල්

- **කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගෝලීය ඉල්ලුම පහළ යෑම මධ්‍යයේ 2020 මාර්තු මාසයේ දී ගෝලීය බොරතෙල් මිල ගණන් පෙර නොවූ විරූ ලෙස පහළ මට්ටම්වලට ළඟා වූ අතර, එම කාලයෙන් පසුව ද මිල ගණන් සාපේක්ෂව පහළ මට්ටමකම පැවතුණි.** පෙර වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ එ.ජ. ඩොලර් 64.66ක් වූ බොරතෙල් බැරලයක සාමාන්‍ය මිලට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලය තුළ දී බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 42.82ක් දක්වා පහළ ගියේය. වසර ආරම්භයේ දී භූ-දේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් බොරතෙල් මිල ගණන් ඉහළ ගිය ද, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඉල්ලුම ශීඝ්‍රයෙන් පහළ යෑම සහ රෝග ව්‍යාප්තිය අවම කිරීම හා සම්බන්ධ පියවරවල වක්‍රාකාර බලපෑම හේතුවෙන් මිල ගණන් ශීඝ්‍රයෙන් පහළ ගියේය. 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය සැලකීමේ දී, බ්‍රෙන්ට් බොරතෙල් සඳහා පැවතුණු දෛනික වැඩිම මිල වූ බැරලයකට එ.ජ. ඩොලර් 70.21ක අගය 2020 ජනවාරි මස 08 වෙනිදා වාර්තා විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී බැරලයකට එ.ජ. ඩොලර් 13.03ක් වූ අඩුම මිල 2020 අප්‍රේල් 22 වැනිදා වාර්තා වූ අතර, එය 2000 වසරේ සිට වාර්තා කළ පහළම මිල මට්ටම විය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, 2020 ජනවාරි මස වාර්තා කළ බැරලයකට එ.ජ. ඩොලර් 58.28ක් වූ ඩබ්.ටී.අයි. සාමාන්‍ය මිල ද 2020 අප්‍රේල් මාසයේ දී බැරලයකට එ.ජ. ඩොලර් 19.03ක් දක්වා පහළ ගියේය. ඉල්ලුම පහළ යෑම සහ ගබඩා ධාරිතාව සීමිත වීම මධ්‍යයේ වුව ද අඛණ්ඩව නිෂ්පාදනය සිදු කිරීම හේතුවෙන්, විශේෂයෙන්ම, ඉතිහාසයේ ප්‍රථම වරට සෘණ මිල මට්ටමක් කරා ළඟා වෙමින්, 2020 අප්‍රේල් 21 වන දින ඩබ්.ටී.අයි. මිල බැරලයකට එ.ජ. ඩොලර් 37.63ක සෘණ අගයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, එයින් පසුව ප්‍රධාන තෙල් නිපදවන රටවල් සිය නිෂ්පාදනය කප්පාදු කිරීම සහ ප්‍රධාන ආර්ථිකයන්හි පැවති සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම හේතුවෙන් 2020 මැයි මාසයේ සිට ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ගණන් ඉහළ ගිය අතර, 2020 සැප්තැම්බර් මස අග වන විට බැරලයක මිල එ.ජ. ඩොලර් 40.65කට ළඟා විය. සමස්තයක් වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතාව අනුව යමින් 2019 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ බැරලයකට එ.ජ. ඩොලර් 69.13ක් වශයෙන් වාර්තා වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී බැරලයකට එ.ජ. ඩොලර් 45.53ක් දක්වා පහළ ගියේය.

**3.1 රූප සටහන**

**ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල හා ලං.ඛ.නී.සං. විසින් ආනයනය කළ බොරතෙල් මිල**





*මූලයන්:* බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

- **මාර්තු මස අග භාගයේ සිට ආර්ථික හා සමාජ කටයුතු සඳහා සීමා පැනවීම හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වල ඇති වූ පසුබෑම පෙන්නුම් කරමින්, 2020 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී ආර්ථිකයේ සියලු අංශ සඳහා දේශීය ඛනිජ තෙල් අලෙවිය පහළ යෑමක් පෙන්නුම් කළේය.** ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ලං.ඛ.නී.සං. සහ ලංකා ඉන්දියානු තෙල් සමාගම යන දෙකෙහිම අලෙවියේ පසුබෑමක් වාර්තා කරමින් 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දේශීය වෙළඳපොළේ සමස්ත දේශීය ඛනිජ තෙල් අලෙවිය සියයට 21.7ක පසුබෑමක් පෙන්නුම් කළේය. මෙම කාලය තුළ දී ලං.ඛ.නී.සං. හි සහ ලංකා ඉන්දියානු තෙල් සමාගමෙහි දේශීය අලෙවිය පිළිවෙළින්, සියයට 18.5කින් සහ සියයට 46.3කින් පහළ ගියේය. විශේෂයෙන්ම, කොවිඩ්-19 ආශ්‍රිතව සංචරණ සීමා පැනවීම නිසා ප්‍රවාහන ක්‍රියාකාරකම්වලට ඇති වූ බලපෑම පිළිබිඹු කරමින්, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී ලං.ඛ.නී.සං. විසින් ප්‍රවාහන අංශය වෙත සිදු කළ අලෙවිය සියයට 15.6කින් පහළ ගියේය. 2020 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය පිළිවෙළින්,

3.2 රූප සටහන

## ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්



**3.3 රූප සටහන**
**ප්‍රවාහන අංශය සඳහා පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය**




*මූලයන්:* ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 13.2කින් සහ සියයට 15.6කින් අඩු වීම හේතුවෙන් මේ තත්ත්වය ඇති විය. කෙසේ වෙතත්, අප්‍රේල් අග භාගයේ සිට සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීමත් සමඟ පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණු අතර, 2020 අගෝස්තු මාසය වන විට අලෙවිය වසංගතයට පෙර පැවති තත්ත්වයට ළඟා විය. අදාළ කාලය තුළ දී තාප විදුලි උත්පාදනය සඳහා ඇව් තෙල් අලෙවිය සියයට 0.5කින් පමණ සුළු වශයෙන් පහළ ගිය අතර, ජල විදුලිබල උත්පාදනයේ දායකත්වය ඉහළ යෑමත් සමඟ විදුලිබල උත්පාදනය සඳහා ඩීසල් අලෙවිය සියයට 58.0කින් සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ ගියේය. තවද, කාර්මික කටයුතුවලට එල්ල වූ බාධා මධ්‍යයේ, 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ කාර්මික අංශය සඳහා ඛනිජ තෙල් නිෂ්පාදන අලෙවිය ද සියයට 4.7කින් පහළ ගියේය. ඒ අනුව, සලකා බලනු ලබන කාලය තුළ කාර්මික අංශය සඳහා භූමිතෙල් අලෙවිය සියයට 43.6කින් පහළ ගිය අතර, ඇව් තෙල් අලෙවිය සියයට 4.9කින් ඉහළ ගියේය. 2020 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ දී ගෘහස්ථ අංශයේ භූමිතෙල් සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු පරිභෝජනය පිළිවෙළින්, සියයට 14.5කින් සහ සියයට 15.9කින් පහළ ගියේය.


- **2019 සැප්තැම්බර් සිට පෙට්‍රල් සහ ඩීසල් මිල ගණන් සංශෝධනයකින් තොරව පවත්වා ගෙන යමින්, තෙල් මිල ගණන් පහළ යෑමේ වාසි ආර්ථිකය තුළ සාධාරණ ලෙස බෙදී යෑම තහවුරු කිරීම සඳහා 2020 මාර්තු මාසයේ දී රජය විසින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී.** 2020 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් ලබා ගන්නා ලද රුපියල් බිලියන 50ක (මුහුණත් අගය) මූලික ප්‍රාග්ධනය යොදාගෙන මෙම මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී. මෙයට අමතරව, 2020 අප්‍රේල් මස අග සිට පෙට්‍රල්, සුපිරි ඩීසල් සහ සුදු ඩීසල් ආනයනය සඳහා රජය විසින් ඉන්ධන අධිභාර පැන වූ අතර, එම ආදායම් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල වෙත යොමු කරන ලදී. මෙම අරමුදලේ එකතු වූ මුදල් ලං.ඛ.නී.ස. මගින් පියවිය යුතු ගෙවීම් සඳහා භාවිත කරන ලද අතර, කොටසක් ලං.ඛ.නී.සං. විසින් බැංකු පද්ධතියට පියවිය යුතු ගෙවීම් සඳහා ද භාවිත කරන ලදී. 2019 අග සිට, ලං.ඛ.නී.සං. පෙට්‍රල් 92, පෙට්‍රල් 95 සහ සුදු ඩීසල්වල මිල ගණන් පිළිවෙළින්, ලීටරයට රුපියල් 137.00, රුපියල් 161.00 සහ රුපියල් 104.00 අගයයන්හි නොවෙනස්ව පවත්වාගෙන ගියේය. මේ අතර, 2020 පළමු භාගය තුළ දී ලංකා ඉන්දියානු තෙල් සමාගම දේශීය සිල්ලර මිල ගණන් තෙවරක් සංශෝධනය කළේය. 2020 මැයි මස අග වන විට ලංකා ඉන්දියානු තෙල් සමාගම විසින් අලෙවි කරන ලද පෙට්‍රල් 92, එක්ස්ට්‍රා ප්‍රිමියම් පෙට්‍රල් 95 සහ සුදු ඩීසල්වල මිල ගණන් පිළිවෙළින්, ලීටරයට රුපියල් 137.00, ලීටරයට රුපියල් 164.00 සහ ලීටරයට රුපියල් 104.00 ලෙස පැවතුණි. 2019 ජූලි මස සිට ලං.ඛ.නී.සං. විසින් ලං.වි.ම. හි තාප විදුලිබල උත්පාදනය සඳහා ලීටරයක් රුපියල් 96.00ක මිලකට ඉන්ධන සපයනු ලැබුව ද, 2020 මාර්තු මස 27 වැනි දා සිට මෙම මිල ලීටරයකට රුපියල් 70.00ක් දක්වා පහළ දමන ලදී. පසුව, 2020 අප්‍රේල් 08 වැනි දා සිට මෙම සහනය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයින් සඳහා ද ලබා දෙන ලදී.

### විදුලිබලය

- **කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීමට ගත් පියවර මධ්‍යයේ විදුලිබල ඉල්ලුම පහළ යෑම නිසා, 2020 ජනවාරි සිට ජූලි දක්වා වූ කාලය තුළ දී සමස්ත විදුලිබල උත්පාදනය, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ ගි.වො.පැ. 9,386 හා සැසඳීමේ දී ගි.වො.පැ. 8,987ක් දක්වා සියයට 4.3කින් පහළ ගියේය.** 2020 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී, විදුලිබල උත්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙළින්, සියයට 4.8කින් සහ සියයට 8.4කින් ඉහළ ගිය ද, 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල දී විදුලිබල උත්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙළින්, සියයට 8.0ක, සියයට 16.4ක සහ සියයට 12.9ක පසුබෑමක් පෙන්නුම්

**3.4 රූප සටහන**


**නව විදුලිබල සම්බන්ධතා (සංඛ්‍යාව)**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

**3.5 රූප සටහන**

**මාසික විදුලිබල උත්පාදනය**





මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

කළේය. කෙසේ වෙතත්, ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ, 2020 ජූනි මස සිට සමස්ත විදුලිබල උත්පාදනය ඉහළ ගියේය. 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී ජලාශවල ජල මට්ටම යහපත් මට්ටමක පැවතීම හේතුවෙන් පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2020 ජනවාරි සිට ජූලි දක්වා වූ කාලය තුළ ජල විදුලිබල උත්පාදනය ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, ජල විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 1,853ක් දක්වා සියයට 20.4කින් ඉහළ ගියේය. මේ අතර, ඛනිජ තෙල්වලට වඩා අඩු මූල්‍ය පිරිවැයක් සහිත බැවින් ගල් අඟුරු බලශක්තිය යොදා ගැනීම සඳහා ලං.වි.ම. යොමුවීම හේතුවෙන්, 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී, ගල් අඟුරු මගින් විදුලිබල උත්පාදනය ද ගි.වො.පැ. 3,559ක් දක්වා සියයට 4.8කින් ඉහළ ගියේය. 2019 ජනවාරි සිට ජූලි තෙක් කාලය හා සංසන්දනය කළ විට, විදුලිබලය සඳහා පැවැති අඩු ඉල්ලුම සමඟම ජල සහ ගල් අඟුරු පාදක විදුලිබල උත්පාදනය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී ද්‍රව ඉන්ධන මගින් විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 2,686ක් දක්වා සියයට 25.7කින් පහළ ගියේය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, සුළු පරිමාණ ජල විදුලිය සහ පියැසි මත නිපදවන සූර්ය විදුලිබලය ද ඇතුළුව, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව හරහා සිදුකරනු ලබන විදුලිබල උත්පාදනය සියයට 6.8කින් ඉහළ ගියේය. ඒ අනුව, 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී, සමස්ත විදුලිබල උත්පාදනය සඳහා ජල, ගල් අඟුරු, ද්‍රව ඉන්ධන සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභවයන්ගේ දායකත්වය පිළිවෙළින්, සියයට 20.6ක්, සියයට 39.6ක්, සියයට 29.9ක් සහ සියයට 9.9ක් විය. මේ අතර, රටේ සමස්ත විදුලබල උත්පාදනයෙන් සියයට 70.6කට ලං.වි.ම. දායක වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල උත්පාදකයන් විසින් ජනනය කරන ලදී. ආර්ථික සහ සමාජ කටයුතු සීමා කළ කාලසීමාව තුළ විදුලි බිල්පත් නිකුත් කිරීමේ දී මතු වූ ගැටලු පිළිබඳව නිසි අවධානය යොමු කළ

**3.6 රූප සටහන**

**විදුලිබල උත්පාදන සංයුතිය (ජන-ජූලි)**




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

3

යුතු නමුත්, 2020 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ දී සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ අලාභය සමස්ත උත්පාදනයෙන් දළ වශයෙන් සියයට 8.6ක් පමණ වන බව තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මේ අතර, 2020 ජූලි අග වන විට රටේ සමස්ත ස්ථාපිත විදුලිබල උත්පාදන ධාරිතාව මෙ.වො. 4,316ක් විය.

- **ලං.වි.ම. හි තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2020 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ සමස්ත විදුලිබල අලෙවිය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වූ ගි.වො.පැ. 8,519 සිට ගි.වො.පැ. 8,218ක් දක්වා සියයට 3.5කින් පහළ ගියේය.** ගෘහස්ථ හා රාජ්‍ය අංශ හැර අනිකුත් සියලු අංශවල ඉල්ලුම පහළ යෑම අලෙවිය අඩු වීමට හේතුවිය. ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම නිසා ජනතාවට ඔවුන්ගේ නිවෙස්වල රැඳී සිටීමට සිදුවීම හේතුවෙන් 2020 ජූලි මාසයෙන් අවසන් වූ මාස හත තුළ දී ගෘහස්ථ අංශයට වූ අලෙවිය සියයට 7.8කින් ඉහළ ගියේය. මෙම කාලය තුළ දී ලං.වි.ම. හි සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 36.7ක් සඳහා ගෘහස්ථ අංශය දායක විය. තවද, සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 1.5ක් සඳහා රාජ්‍ය අංශය දායක වූ අතර, රාජ්‍ය අංශය සඳහා වූ අලෙවිය සියයට 1.2කින් වර්ධනය විය. මේ අතර, කර්මාන්ත, පොදු කාර්ය සහ හෝටල් අංශ සඳහා වූ විදුලිබල අලෙවිය පිළිවෙළින්, සියයට 10.2කින්, සියයට 8.8කින් සහ සියයට 26.7කින් පහළ ගියේය. කර්මාන්ත, පොදු කාර්ය සහ හෝටල් යන අංශ සමස්ත විදුලිබල අලෙවියෙන් පිළිවෙළින්, සියයට 27.7කට, සියයට 20.0කට සහ සියයට 1.4කට දායකත්වය දැක්වීය. ඩිජිටල්කරණය කරන ලද මනු කියවීමේ පහසුකම් නොමැතිකම නිසා කොවිඩ්-19 හේතුවෙන් ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තැබූ කාලසීමාව තුළ මනු කියවීමේ දී ලං.වි.ම. සැලකිය යුතු අන්දමේ දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, ආර්ථික සහ සමාජ කටයුතු සීමා කළ කාලපරිච්ඡේදය අවසන් වූ පසු සේවකයන් ලවා මනු කියවීම ඇරඹීමත් සමග පාරිභෝගික බිල්පත් සම්බන්ධයෙන් ගැටලු සහ පැමිණිලි රැසක් මතු විය.

- **ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාව තුළ විදුලිබල පරිභෝජනය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ට ඇති වූ මූල්‍ය අපහසුතා අඩු කිරීම සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී.** මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් පාරිභෝගිකයන්ට සාධාරණයක් වන අයුරින් ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාල සීමාව සඳහා මාසික විදුලි බිල් නිකුත් කිරීමට ලං.වි.ම.ට සහ ලංකා විදුලි සමාගමට මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. විදුලි බිල්පත් සඳහා ගෙවීම් සිදු නොකිරීම නොසලකමින් ලං.වි.ම. සහ ලංකා විදුලි සමාගම විසින් ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාව තුළ දී අඛණ්ඩව විදුලිය සපයන ලදී. ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාව තුළ ලං.වි.ම., ලංකා විදුලි සමාගම මෙන්ම ගෘහස්ථ අංශය හා ව්‍යාපාර මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් මෙම මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මගින් ප්‍රමාණානුකූල පදනමක් මත විදුලි ඒකක ගණනය කර බිලෙහි වටිනාකම ගණනය කිරීමේ ක්‍රම නියම කරන ලදී. මේ අතර, ආර්ථික සහ සමාජ කටයුතු සීමා කර තිබූ කාලසීමාවෙන් අනතුරුව පාරිභෝගිකයන්ට විදුලි බිල්පත් නිකුත් කිරීමෙන් පසුව එම බිල්පත් පියවීම සඳහා ප්‍රමාණවත් සහන කාලයක් ලබා දෙන ලදී. ඒ අනුව, අදාළ සහන කාලය අවසන් වන තුරු මෙම බිල්පත් සම්බන්ධයෙන් විදුලි සැපයුම විසන්ධි නොකරන ලෙස ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ලං.වි.ම. ට සහ ලංකා විදුලි සමාගමට උපදෙස් ලබා දුන්නේය. මේ අතර, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින්, ලං.වි.ම., ලංකා විදුලි සමාගම සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග එක්ව, ඇඳිරි නීතිය පැවති කාලය තුළ විදුලි පද්ධති හා ජල නල සම්බන්ධ ගැටලු විසඳීම සඳහා පාරිභෝගිකයන්ට ඔවුන්ට අදාළ ප්‍රදේශවල සිටින ලියාපදිංචි විදුලි කාර්මිකයන් සහ ජලනල කාර්මිකයන් සම්බන්ධ කර ගැනීම සඳහා ක්ෂණික ඇමතුම් සේවාවක් ක්‍රියාත්මක කරන ලදී. බස්නාහිර පළාතෙන් ආරම්භ කෙරුණු මෙම සේවය පසුව අනෙකුත් දිස්ත්‍රික්කවලට ද ව්‍යාප්ත කරන ලදී.

- **2020 වසරේ මුල් භාගයේ දී, කොවිඩ්-19 වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා ආර්ථික සහ සමාජ කටයුතු සීමා කිරීම හේතුවෙන් නව බලාගාර ඉදිකිරීමට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතියට බාධා එල්ල විය.** 2020 ජූනි මස අවසානය වන විට බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වේල්ල, ප්‍රධාන උමං මාර්ගය, හැරවුම් උමග, විදුලි බලාගාරය සහ ස්විච් අංගන භූමිය හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු සියයට 72.3ක භෞතික ප්‍රගතියක් අත් කරගෙන ඇත. මෙ.වො. 35ක ධාරිතාවයකින් යුත් බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල

විදුලි ව්‍යාපෘතිය 2021 ජනවාරි වන විට ජාතික විදුලි බල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, මෙ.වො. 30.5ක ධාරිතාවයකින් යුතු මොරගොල්ල ජල විදුලි ව්‍යාපෘතියට අදාළ ඉඩම් අත්පත් කරගැනීම, ප්‍රාරම්භක කටයුතු සහ ඉදිකිරීම් කටයුතු 2020 මුල් භාගයේ දී අඛණ්ඩව සිදු විය.

- **2020 වසරේ මුල් භාගයේ දී, රටේ විදුලිබල සැපයුම් මට්ටම ඉහළ නැංවීමට මෙන්ම පුනර්ජනනීය බලශක්තිය භාවිතය ප්‍රවර්ධනය කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය.** සලකා බලනු ලබන කාලය තුළ, පවුල් 2,319කට ප්‍රතිලාභ සලසමින් ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම 17ක් සම්පූර්ණ කරන ලදී. මේ අතර, 2020 වසරේ මුල් භාගයේ දී *සූර්යබල සංග්‍රාමය* ව්‍යාපෘතිය යටතේ, පාරිභෝගිකයන් 395ක් ශුද්ධ මනු ක්‍රමය හරහා ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කර ඇති අතර, විදුලිබල පද්ධතියට මෙ.වො. 3.1ක් එකතු කර ඇත. තවද, ශුද්ධ ගිණුම්කරණ යෝජනා ක්‍රමය යටතේ මෙ.වො. 10.4ක් එක්කරමින් පාරිභෝගිකයන් 1,050ක් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇති අතර, නෙට් ප්ලස් යෝජනා ක්‍රමය යටතේ මෙ.වො. 10.3ක් එකතු කරමින් විදුලි නිෂ්පාදකයින් 126ක් මෙම ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇත. 2020 ජූනි මස අවසානය වනවිට මෙරට සූර්ය බලශක්ති උත්පාදනය සූර්ය බලශක්ති පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයින් 18,628කින් සමන්විත වූ අතර, සූර්ය බලශක්ති ධාරිතාව මෙ.වො. 222.7ක් විය.

### මාර්ග සංවර්ධනය

- **මාර්ග සංවර්ධන සහ පුනරුත්ථාපන කටයුතු 2020 වසරේ පළමු භාගය තුළ දී මන්දගාමී වේගයකින් යුතුව වුව ද අඛණ්ඩව සිදු විය.** මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ.) විසින් 2020 වසරේ පළමු භාගය තුළ දී මාර්ග නඩත්තු කටයුතු, අධිවේගී මාර්ග හා මහාමාර්ග සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වාභාවික ආපදාවලින් බලපෑමට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් බිලියන 69.6ක වියදමක් දරා ඇත. මෙම සමස්ත වියදමෙන් සියයට 60කට වඩා වැඩි ප්‍රමාණයක් මහාමාර්ග සංවර්ධනය සඳහා යොදවා ඇති අතර, ආසන්න වශයෙන් සමස්ත වියදමෙන් සියයට 24ක් පමණ අධිවේගී මාර්ග සංවර්ධනය සඳහා යොදවා ඇත. 2020 වසරේ පළමු භාගය තුළ දී මා.සං.අ. මගින්, අධිවේගී මාර්ග ද ඇතුළුව නඩත්තු කරනු ලැබූ ජාතික මහා මාර්ගවල සමස්ත දිග ප්‍රමාණය කිලෝමීටර 12,496ක් වන අතර, නඩත්තු කරනු ලැබූ පාලම් ප්‍රමාණය 4,662ක් පමණ විය. කෙසේ වෙතත්, රජය විසින් රට පුරා ආර්ථික හා සමාජ කටයුතු සඳහා පනවනු ලැබූ සීමා මගින් මාර්ග සහ පාලම් ඉදිකිරීම් කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන ලදී.

- **අධිවේගී මාර්ග පද්ධතියට අදාළ ඉදිකිරීම් කටයුතු 2020 වසරේ පළමු භාගය තුළ දී මන්දගාමී වේගයකින් ක්‍රියාත්මක විය.** මත්තල දක්වා දිවෙන අධිවේගී මාර්ග කොටසක් ද සහිතව, මාතර සිට හම්බන්තොට දක්වා දිවෙන දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය 2020 වසරේ පළමු භාගය තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගොඩගම-පාලටුව-බෙලිඅත්ත-බරවාකුඹුක දක්වා දිවෙන අධිවේගී මාර්ග කොටස 2020 පෙබරවාරි 25 වැනි දින මහජනතාව සඳහා විවෘත කරන ලදී. අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ද සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2020 ජූනි මස අවසානය වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 98.7ක් විය. මේ අතර, කඩවත සිට මීරිගම දක්වා සහ මීරිගම සිට කුරුණෑගල දක්වා වන මධ්‍යම අධිවේගී මාර්ගයේ කොටස්වල ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කෙරුණු අතර, මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අදාළව පොතුහැර සිට ගලගෙදර දක්වා සහ කුරුණෑගල සිට දඹුල්ල දක්වා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු 2020 පළමු භාගය තුළ දී අඛණ්ඩව සිදු විය. රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ තුන්වන අදියර යටතේ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරුණු අතර, 2020 ජූනි මස අවසානය වන විට ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව භෞතික ප්‍රගතිය සියයට 79ක් ද, විමර්ශන, සැලසුම් සහ ප්‍රසම්පාදන කටයුතුවලට අදාළ භෞතික ප්‍රගතිය සියයට 35ක් ද විය. මධ්‍යම අධිවේගී මාර්ගයේ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම සඳහා, මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන කොටස ව්‍යාපෘතිය යටතේ පස්යාල සිට ගිරිඋල්ල දක්වා (කිලෝමීටර් 13.0) මහාමාර්ගය සහ අලව්ව සිට දම්පැලැස්ස දක්වා (කිලෝමීටර් 3.36) මහාමාර්ගය යන ජාතික මහාමාර්ග දෙකෙහි ඉදිකිරීමේ කටයුතු 2020 වසරේ පළමු භාගය තුළ දී ආරම්භ කෙරුණි. උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය යටතේ මැදවච්චිය සිට හොරොව්පතාන දක්වා මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ මග නැගුම වැඩසටහන 2020 වසරේ පළමු භාගය තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක කෙරුණි.

- **කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය සමඟ මතු වූ අවිනිශ්චිතතා මධ්‍යයේ, මාර්ග සහ පාලම් සංවර්ධන වැඩසටහන් කිහිපයක් 2020 වසරේ පළමු භාගය තුළ දී ආරම්භ කෙරුණි.** සංචරණ සීමා පැනවීම හේතු කොටගෙන මාර්ග හා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක භෞතික ප්‍රගතිය කෙරෙහි බලපෑම් ඇති විය. නව කැළණි පාලම සමඟ පිටත වටරවුම් අධිවේගී මාර්ගය සම්බන්ධ කරමින් ඉදි වන කුලුනු මතින් දිවෙන අධිවේගී මාර්ගයේ පළමු අදියරේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම සම්පූර්ණ කරන ලද අතර, එම ව්‍යාපෘතියේ දෙවන අදියරේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ කටයුතු ද ක්‍රියාත්මක විය. යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගයට අදාළ ශක්‍යතා අධ්‍යයනය 2018 වසරේ පළමු භාගය තුළ දී අවසන් කර තිබුණ ද, ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා වූ අධිවේගී මාර්ග කොටස සඳහා විශේෂ සැලකිල්ලක් දක්වමින්, ශක්‍යතා අධ්‍යයනය නැවත ඇගයීමට තීරණය වී ඇත. කහතුඩුව සිට ඉංගිරිය දක්වා අධිවේගී මාර්ග කොටසට අදාළ ඉඩම් අත්පත් කර ගැනීම සහ සිවිල් වැඩ ප්‍රසම්පාදනය ඇතුළත්ව, පූර්ව ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පැවතිණි. මේ අතර, දෙහිවල සිට පානදුර දක්වා සමුද්‍රාසන්න මාර්ගය (Marine Drive) දීර්ඝ කිරීම හා කොච්චිකඩේ අතුරු මාර්ගය (Bypass) ඉදි කිරීමට අදාළ ශක්‍යතා අධ්‍යයන ද ක්‍රියාත්මක විය. අලව්ව සහ මුත්තෙට්ටුගල දුම්රිය හරස් මාර්ග හරහා ගුවන් පාලම් ඉදි කිරීමට අදාළ ශක්‍යතා අධ්‍යයන 2020 ජූනි අවසානය වන විට සම්පූර්ණ කරන ලද අතර, කොම්පඤ්ඤ වීදිය ගුවන් පාලම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය සිදු කෙරෙමින් පැවතුණි.

## මාර්ගස්ථ මගී ප්‍රවාහනය

- **කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය හේතුවෙන් පනවන ලද සංචරණ සීමාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ පළමු භාගය තුළ දී පොදු මගී ප්‍රවාහන අංශයේ කාර්යසාධනය මන්දගාමී විය.** රට තුළ ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීමත් සමඟ පොදු මගී ප්‍රවාහන කටයුතු නැවතිණි. අප්‍රේල් මස අවසානයේ සිට සංචරණ සීමා ක්‍රමයෙන් ලිහිල් කෙරුණු අතර, කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක හැර සෙසු සියලු දිස්ත්‍රික්කවල පොදු මගී ප්‍රවාහනය ක්‍රමයෙන් නැවත ආරම්භ කරන ලදී. මැයි මාසයේ සිට කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා බලපැවැත්වූ දිවා කාලයේ ඇඳිරි නීතිය ලිහිල් කිරීමත් සමඟ, රජය විසින් ලබා දුන් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව අන්තර් පළාත් සහ පළාත් තුළ පොදු ප්‍රවාහන සේවා දීප ව්‍යාප්තව ආරම්භ විය. ඒ අනුව, 2020 වසරේ පළමු භාගය සලකා බැලීමේ දී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම.) සහ පෞද්ගලික බස් ක්‍රියාකරුවන් යන දෙඅංශයේ ම ක්‍රියාකාරිත්වය ධාවන කිලෝමීටර් සහ මගී කිලෝමීටර් ප්‍රමාණය අනුව සැලකිය යුතු පහළ යෑමක් පෙන්නුම් කළේය. ශ්‍රී ලං.ග.ම.හි ධාවන කිලෝමීටර් ප්‍රමාණය සහ මගී කිලෝමීටර් ප්‍රමාණය, පෙර වසරේ පළමු භාගය හා සැසඳීමේ දී, 2020 පළමු භාගය තුළ දී පිළිවෙළින්, සියයට 35.7කින් සහ සියයට 39.2කින් පහළ ගියේය. මේ අතර, 2020 වසරේ පළමු භාගය තුළ දී පෞද්ගලික අංශයේ බස් රථවල ද මගී කිලෝමීටර් ප්‍රමාණය සහ ධාවන කිලෝමීටර් ප්‍රමාණය පිළිවෙළින්, සියයට 69.8කින් සහ සියයට 72.3කින් පහළ ගියේය. 2020 ජූනි මස අවසානය වන විට, ධාවනයේ පැවති පෞද්ගලික අංශයේ සමස්ත බස් රථ ප්‍රමාණය 15,097ක් වූ අතර, එය ඇණියේ පැවති මුළු පෞද්ගලික බස් රථ සංඛ්‍යාවෙන් සියයට 75.2ක් විය. 2020 ජූනි අවසානය වන විට පෞද්ගලික අංශය මගින් ධාවනයෙහි යෙදවූ බස් රථවල අන්තර් පළාත් සහ පළාත් තුළ බස් රථ ධාවන බලපත්‍ර ගණන පිළිවෙළින්, 3,034ක් සහ 17,026ක් විය.

### 3.1 සංඛ්‍යා සටහන
### මාර්ගස්ථ මගී ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය

| අයිතමය | 2019 ජන-ජූනි | 2020 ජන-ජූනි (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලං.ග.ම)** | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 213 | 137 | - 35.7 |
| මගී කිලෝමීටර් (මිලියන) | 7,110 | 4,324 (ආ) | - 39.2 |
| අයත් බස් රථ සංඛ්‍යාව | 6,948 | 7,273 | 4.7 |
| ධාවනය වූ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 5,094 | 3,618 | -29.0 |
| **පෞද්ගලික අංශය** | | | |
| ධාවන කිලෝමීටර් (මිලියන) | 541 | 150 | - 72.3 |
| මගී කිලෝමීටර් (මිලියන) | 27,024 | 8,149 | - 69.8 |
| අයත් බස් රථ සංඛ්‍යාව | 20,016 | 20,060 | 0.2 |
| ධාවනය වූ බස් රථ සංඛ්‍යාවේ සාමාන්‍යය | 18,662 | 15,097 | - 19.1 |
| පළාත් අතර ධාවනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව | 3,133 | 3,034 | - 3.2 |
| පළාත තුළ ධාවනය සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව | 16,883 | 17,026 | 0.8 |

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

*මූලයන්:* ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

### 3.2 සංඛ්‍යා සටහන
### රථවාහන නව ලියාපදිංචිය


| අයිතමය | 2019 ජන-සැප් | 2020 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| බස් රථ | 1,099 | 507 | - 53.9 |
| මෝටර් රථ | 28,574 | 20,048 | - 29.8 |
| ත්‍රිරෝද රථ | 12,144 | 7,040 | - 42.0 |
| ද්විත්ව කාර්ය වාහන | 9,933 | 9,092 | - 8.5 |
| යතුරු පැදි | 223,728 | 144,399 | - 35.5 |
| භාණ්ඩ ප්‍රවාහන වාහන | 4,136 | 3,102 | - 25.0 |
| ඉඩම් වාහන | 5,531 | 5,790 | 4.7 |
| රෝද හතරේ සයිකල් සහ මෝටර් නිවාස | 981 | 464 | - 52.7 |
| **එකතුව** | **286,126** | **190,442** | **- 33.4** |

(අ) තාවකාලික

*මූලය:* මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

**3.7 රූප සටහන**

**රථවාහන නව ලියාපදිංචිය**




*මූලය:* මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

- **කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් පැන නැගුන සීමා මධ්‍යයේ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මාර්ගස්ථ මගී ප්‍රවාහන පහසුකම් සැපයීම සහ ආවරණය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව පියවර ගන්නා ලදී.** ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් දියත් කිරීමට නියමිතව තිබූ නව බස් රථ සේවා, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය සමග තාවකාලිකව නවතා දැමුණි. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, නව *සිසු සැරිය* සේවා අටක් පමණක් දියත් කළ අතර, මෙම වැඩසටහන යටතේ වර්තමානයේ ක්‍රියාත්මක වන සමස්ත බස් රථ ප්‍රමාණය 1,427ක් වේ. පාසල් සිසුන් හා ගුරුවරුන් වෙත විධිමත් ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා *සිසු සැරිය* ව්‍යාපෘතිය පුළුල් කිරීම සහ ප්‍රචලිත කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පියවර ගෙන ඇත. මේ අතර, *ගැමි සැරිය* සහ *නිසි සැරිය* බස් රථ සේවා ව්‍යාපෘති යටතේ, ව්‍යාපෘති හතරක් පමණක් 2020 වසරේ පළමු භාගය තුළ දී දියත් කරන ලදී. ඒ අනුව, 2020 ජූනි මස අවසානය වන විට *ගැමි සැරිය* සේවා 16ක් සහ *නිසි සැරිය* සේවා 182ක් ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

- **සීමිත විදේශ විනිමය ප්‍රවාහ ලැබීම් මධ්‍යයේ විනිමය අනුපාතිකය මත වූ පීඩනය අවම කිරීම සඳහා රජය සහ මහ බැංකුව විසින් අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන මත පැනවූ සීමාකිරීම්, නව රථවාහන ලියාපදිංචි කිරීම පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතීමට හේතු විය.** 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ දී ලියාපදිංචි කළ නව මෝටර් රථ සංඛ්‍යාව, සියයට 33.4කින් පහළ ගිය අතර, 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ දී සියයට 23.3ක පහළ යෑමක් වාර්තා විය. මෙම පහළ යෑම, ඉඩම් වාහන හැර සෙසු සියලු රථවාහන කාණ්ඩවල දක්නට ලැබුණි.

## දුම්රිය ප්‍රවාහනය

- **වසරේ මුල් මාස දෙක තුළ සුමට ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ ද, කොවිඩ්-19 වසංගතය මෙරට පැතිරීමත් සමග ප්‍රදේශ හරහා සිදු වන පුද්ගල සංචරණය සීමා කිරීම සහ භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් ගන්නා ලද දැඩි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ) 2020 පළමු භාගය තුළ දී මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය.** 2020 මුල් භාගයේ දී දුම්රිය මාර්ග මගී කිලෝමීටර ප්‍රමාණය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ මගී කිලෝමීටර බිලියන 3.6ක සිට බිලියන 2.0ක් දක්වා සියයට 42.8කින් අඩු වී ඇත. මේ අතර, 2020 වසරේ පළමු භාගයේ දී භාණ්ඩ කිලෝමීටර ප්‍රමාණය, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් මිලියන 61.2 සිට මෙට්‍රික් ටොන් මිලියන 50.6ක් දක්වා සියයට 17.3කින් අඩු වී තිබේ. සංචරණ සීමා ක්‍රමානුකූලව ලිහිල් කිරීමත් සමඟ, ශ්‍රී ලං.දු.සේ. මැයි මස මුල සිට සිය සේවා සීමා සහිතව නැවත ආරම්භ කළ අතර, ජූනි මස මුල සිට සිය සුපුරුදු කාල සටහන නැවත ආරම්භ කළේය. සාමාන්‍ය ජනතාවට ආරක්ෂිත වූ ප්‍රවාහන සේවා සැපයීම සහතික කිරීම සඳහා ශ්‍රී ලං.දු.සේ. විසින් කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලදී.

- **කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟම පැන වූ සීමා හේතුවෙන් ශ්‍රී ලං.දු.සේ. මගින් ක්‍රියාත්මක කෙරුණු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති මෙන්ම නඩත්තු කටයුතුවලට ද යම් යම් බාධා මතු විය.** මහව-ඕමන්තෙයි දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ මූලික කටයුතු ආරම්භ කර තිබුණ ද, 2020 මුල් භාගයේ දී ව්‍යාපෘතිය ප්‍රමාද විය. කෙසේ වෙතත්,

**3.3 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ක්‍රියාකාරිත්වය**

| අයිතමය | 2019 ජන-ජූනි | 2020 ජන-ජූනි (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ධාවන කිලෝමීටර් (මිලියන) | 5.3 | 3.7 | - 29.8 |
| මගී කිලෝමීටර් (මිලියන) | 3,594 | 2,057 | - 42.8 |
| භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන) | 61.2 | 50.6 | - 17.3 |

(අ) තාවකාලික

*මූලය:* ශ්‍රී ලංකා දුම්රිය සේවය

3

3

ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයන කටයුතු ශ්‍රී ලං.දු.සේ. විසින් සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගතය පැතිරී යෑමෙන් ඇති වූ බාධා හේතුවෙන්, ශ්‍රී ලං.දු.සේ. විසින් වසරේ මුල් භාගයේ දී සිදු කරන ලද දුම්රිය නඩත්තු කටයුතු සීමා සහිත විය. කෙසේ වෙතත්, උඩරට දුම්රිය සේවය සඳහා පැවති ප්‍රසම්පාදන සැලසුම් නිම කරමින් ඩීසල් එන්ජින් සහිත දුම්රිය ඒකක හතරක් චීනයෙන් මිල දී ගැනීම හරහා සිය දුම්රිය ඒකක ප්‍රමාණය වැඩිදියුණු කිරීමට ශ්‍රී ලං.දු.සේ. සමත් විය. මීට අමතරව, ශ්‍රී ලං.දු.සේ. විසින් මෙම කාලය තුළ දී මගී මැදිරි 200ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලං.දු.සේ. විසින් නගරාන්තර සේවා සඳහා අමතර එන්ජින් සහිත දුම්රිය කට්ටල මෙන්ම මගී දුම්රිය මැදිරි 160ක් ද මිලදී ගැනීමට පියවර ගන්නා ලදී. රට පුරා පවතින දුම්රිය ස්ථාන පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අඛණ්ඩව ඉදිරියට ගෙන යමින් දුම්රිය ස්ථාන නවයක් පමණ ප්‍රතිසංස්කරණය කරන ලද අතර, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය ආධාරයෙන් සංචාරක ආකර්ෂණය දිනූ ස්ථාන පිහිටි ප්‍රදේශවල දුම්රිය ස්ථාන කිහිපයක ද යම් යම් ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. තවද, ශ්‍රී ලං.දු.සේ.හි මූල්‍ය ප්‍රසම්පාදන, නඩත්තු, පරිපාලන සහ සැලසුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ව්‍යවසාය සමාලෝචන වැඩසටහනක් 2020 මුල් භාගයේ දී ආරම්භ විය. මේ අතර, කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් බස්නාහිර ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අවලංගු කිරීමට තීරණය කරන ලදී.

### සිවිල් ගුවන් සේවය

- **සිවිල් ගුවන් සේවා අංශයට කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බාධා ඇති වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මගී සහ ගුවන්යානා මෙන්ම මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණයේ ද තියුණු පසුබෑමක් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2020 වසරේ මුල් භාගය තුළ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ විසින්, වෙනත් ගුවන් යානා වෙත මාරු වන මගීන් ද ඇතුළුව, හසුරුවන ලද මුළු ජාත්‍යන්තර මගීන් ගණන 2019 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ මගීන් මිලියන 5.8 සිට මගීන් මිලියන 2.4ක් දක්වා සියයට 58.0කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, 2020 මුල් භාගයේ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ විසින් ජාත්‍යන්තර ගුවන් යානා හැසිරවීම් 15,225ක් සහ දේශීයව හසුරුවන ලද ගුවන් යානා 2,774ක් ද ඇතුළු ව හසුරුවන ලද සමස්ත ගුවන් යානා සංඛ්‍යාව 17,999ක් දක්වා සියයට 50.9ක පසුබෑමක් පෙන්නුම් කළේය. 2020 මුල් භාගයේ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ මගින් හසුරුවන ලද සමස්ත භාණ්ඩ ප්‍රමාණය මෙට්‍රික් ටොන් 69,436ක් දක්වා සියයට 43.7කින් පහළ ගියේය. කොවිඩ්-19 ආශ්‍රිත මාර්ගෝපදේශයන්ට අනුකූලව සෞඛ්‍ය හා ආරක්ෂක ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සීමිත ශ්‍රම බලකායක් සමඟ සිය ධාරිතාවට වඩා අඩු ප්‍රමාණයකින් ක්‍රියාත්මක වී තිබේ. දැනට, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ, නෞකා කාර්ය මණ්ඩල මාරු වීම සඳහා සහ පෙරළා මෙරටට පැමිණෙන්නන් එන ගුවන් යානා හැසිරවීමට විකල්ප ගුවන් තොටුපළක් ලෙස භාවිතා කෙරේ. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙතට මෙලෙස මගීන් යොමු කෙරුණ ද, 2020 වසරේ මුල් භාගයේ දී හසුරුවන ලද දේශීය මගීන් ගණන 121ක් දක්වා අඩු වූ අතර, එය 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ මගීන් 1,078ට සාපේක්ෂව සියයට 88.8ක පහළ යෑමකි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2020 වසරේ මුල් භාගයේ දී සියයට 83.3ක පසුබෑමක් පෙන්නුම් කරමින් ගුවන් යානා 106ක් හසුරුවන ලදී. 2020 වසරේ මුල් භාගයේ දී රත්මලාන ගුවන් තොටුපළ සහ මඩකලපුව දේශීය ගුවන් තොටුපළ විසින් සිදු කරන ලද මගී හැසිරවීම් ප්‍රමාණය පිළිවෙලින්, 3,957ක් සහ 727ක් විය. මේ අතර, මේ වසර තුළ දී යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මාර්තු මස 15 වැනි දින සිට ගුවන් තොටුපළ වසා දමන තෙක් මගීන් ගුවන්යානා 136ක් සහ මගීන් 3,482ක් හසුරුවන ලදී.

- **කොවිඩ්-19 වසංගතය පැතිර යෑම හේතුවෙන් රටේ ගුවන් තොටුපළ සහ ගුවන් සේවා අංශය වැඩිදියුණු කිරීමට රජය විසින් සිදු කරගෙන යනු ලැබූ සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය 2020 මුල් භාගය තුළ දී දැඩි ලෙස බලපෑමට ලක් විය.** බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන පර්යන්තය ඉදිකිරීමේ ව්‍යාපෘතිය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන පර්යන්තයක් ඉදි කිරීමේ A පැකේජයෙන් සහ ගගනාංගනයේ ගුවන්යානා නවත්වන කොටස සහ ගුවන්යානා බැහැරුම් පථ ඉදිකිරීමේ B පැකේජයෙන්

සමන්විත වේ. මෙම ව්‍යාපෘති දෙකෙහිම ප්‍රගතිය 2020 මුල් භාගයේ දී සීමිත විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ දෙවන පර්යන්තයක් ඉදි කිරීමට අදාළ ව්‍යාපෘතියෙ A පැකේජය සම්බන්ධව ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම 2020 මාර්තු මාසයේ දී තෝරා ගත් ජපන් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් තැබීය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ බාධා මත ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද විය. මේ අතර, ඉහත ව්‍යාපෘතියේ B පැකේජය 2020 ජූනි අග වන විට සියයට 80ක පමණ ප්‍රගතියක් අත් කරගෙන තිබුණි. තවද, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ භාවිතා කිරීම පුළුල් කිරීම සඳහා ඇති විකල්ප පිළිබඳව ඇගයීමක් සිදු කිරීමේ නිරත විය. එවැනි විකල්ප අතරට, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ භාණ්ඩ හැසිරවීමේ කේන්ද්‍රස්ථානයක් සහ පුද්ගලික අංශයේ සහභාගීත්වයෙන් ගගනගාමී ඉංජිනේරු විද්‍යාව සඳහා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම ඇතුළත් වේ. මේ අතර, ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම, තවත් රජයේ ආයතන කිහිපයක් සමඟ එකතුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළටම වෙන් වූ පිවිසුම් මාර්ගයක් සංවර්ධනය කිරීමේ නිරත වූ අතර, මෙම ව්‍යාපෘතිය 2021 මැයි වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ, මිනුවන්ගොඩ මාර්ගයේ කොටසක වැඩ 2020 මුල් භාගයේ දී අවසන් කරන ලදී. මේ අතර, වසංගතයෙන් පෙර නොවූ විරූ බලපෑමක් ඇති වූ පසුබිමක් තුළ, මගී සංචරණ හේතුවෙන් වෛරසය පැතිරීම අවම කිරීම සඳහා කොවිඩ්-19 හඳුනා ගැනීමේ පරීක්ෂණ ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා ගුවන්තොටුපළ සහ ගුවන් සේවා සමාගම විසින් ගුවන් තොටුපළවල නිරෝධායන ක්‍රියාවලියක් සඳහා යොමු කිරීම්, පී සී ආර් පරීක්ෂණ සිදුකරන රසායනාගාර පිහිටුවීම සහ සංක්‍රමණික සේවකයන් හා විදේශයන්හි සිට පැමිණෙන අනෙකුත් පුද්ගලයන් සඳහා විශේෂ ගුවන් ගමන් සංවිධානය කිරීම ඇතුළු පූර්වෝපායික විධිවිධාන කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ගුවන්තොටුපළ කාර්ය මණ්ඩලය කොවිඩ්-19 රෝගය සඳහා නිරාවරණය වීමට ඇති ඉහළ අවදානම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින්, ගුවන් යානා පරිශ්‍රයේ ද කොවිඩ්-19 රෙගුලාසි දැඩි ලෙස අනුගමනය කරන ලදී.

### වරාය සේවා

- **2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී වරාය ආශ්‍රිත කටයුතු සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කළ ද, බහලු මෙහෙයුම් සහ භාණ්ඩ හැසිරවීම් යන දෙඅංශය ම 2020 වසරේ තෙවන කාර්තුවේ දී ධනාත්මක කාර්යසාධනයක් වාර්තා කළේය.** 2020 ආරම්භයේ සිටම කොවිඩ්-19 මගින් ගෝලීය සැපයුම් දාම කෙරෙහි බාධා ඇති වුව ද, එම බාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිත කටයුතුවලට බලපෑමක් ඇති වූයේ 2020 මාර්තු මාසයේ සිටය. වසරේ ආරම්භක කාලයේ දී ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ වරාය කටයුතු, මාර්තු මාසයේ සිට අඩු වීමට පටන් ගෙන දෙවන කාර්තුව පුරා පසුබෑමට ලක් වුව ද, වසරේ දෙවන භාගය ආරම්භයේ සිටම යළිත් වර්ධනයක් පෙන්නුම් කළේය. 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ දී කොළඹ වරායේ සමස්ත ක්‍රියාකාරිත්වය, බහලු මෙහෙයුම් සහ භාණ්ඩ හැසිරවීම් යන අංශවලින් ගත් කළ, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පිළිවෙළින්, සියයට 4.4ක සහ සියයට 4.9ක පසුබෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, වසරේ තෙවන කාර්තුව පමණක් සැලකීමේ දී 2019 වසරේ අනුරූප කාර්තුවට සාපේක්ෂව කොළඹ වරායේ භාණ්ඩ හැසිරවීම් කටයුතු සහ බහලු මෙහෙයුම් කටයුතු පිළිවෙළින්, සියයට 5.1ක සහ සියයට 4.1ක වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ අඩි විස්සට සමාන බහලු ඒකක (TEUs) මිලියන 5.4 හා සැසඳීමේ දී 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ දී කොළඹ වරාය මගින්, අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 5.2ක් හසුරුවන ලදී. 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.) සහ කොළඹ වරායේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) සතු පර්යන්ත මගින් මෙහෙයවන ලද සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී පිළිවෙළින්, සියයට 7.1ක සහ සියයට 7.9ක පසුබෑමක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දී, කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තයේ (කො.ජා.බ.ප.) මෙහෙයවන ලද සමස්ත බහලු මෙහෙයුම් ප්‍රමාණය, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, සියයට 0.5ක සුළු වර්ධනයක් වාර්තා කළේය. බහලු ප්‍රතිනැව්ගත කිරීම් ගත් කළ, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පර්යන්ත තුනම පසුබෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, ශ්‍රී ලං.ව.අ.,

3

### 3.4 සංඛ්‍යා සටහන
### වරාය සේවා ක්‍රියාකාරිත්වය

| අයිතමය | 2019 ජන-සැප් | 2020 ජන-සැප් (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| පැමිණි නැව් සංඛ්‍යාව (ආ) | 3,513 | 3,320 | - 5.5 |
| මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000) (ආ) | 80,579 | 76,675 | - 4.8 |
| බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ඇ)(ඈ) | 5,428 | 5,190 | - 4.4 |
| බහලු ප්‍රතිනැව්ගත කිරීම් ප්‍රමාණය (TEUs '000) (ඇ)(ඈ)(ඉ) | 4,484 | 4,384 | - 2.2 |

(අ) තාවකාලික

(ආ) කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය වරායයන්හි දත්ත පමණක් ඇතුළත් වේ.


(ඇ) කොළඹ වරායේ දත්ත පමණක් ඇතුළත් වේ.

(ඈ) TEUs - අඩි විස්සට සමාන බහලු ඒකක

(ඉ) නැවත ඇසිරීම් ද ඇතුළුව

*මූලය:* ශ්‍රී ලංකා වරාය අධිකාරිය

### 3.8 රූප සටහන
### වරාය ක්‍රියාකාරකම් වල වර්ධනය - 2020




*මූලයන්:* ශ්‍රී ලංකා වරාය අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

කො.ජා.බ.ප. සහ ද.ආ.පි.ප. මගින් හසුරුවන ලද බහලු ප්‍රතිනැව්ගත කිරීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 5.7ක, සියයට 0.3ක සහ සියයට 0.7ක පසුබෑමක් පෙන්නුම් කළේය. සලකා බලන කාලපරිච්ඡේදයේ දී කො.ජා.බ.ප., ශ්‍රී ලං.ව.අ. සහ ද.ආ.පි.ප. මගින් කොළඹ වරාය තුළ සිදු කෙරුණු සමස්ත බහලු මෙහෙයුම්වලින් පිළිවෙළින්, සියයට 41.3කට, සියයට 31.1කට සහ සියයට 27.6කට දායකත්වය දක්වන ලදී. මේ අතර, 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ දී කොළඹ වරායේ සමස්ත බහලු හැසිරවීම් ප්‍රමාණය සියයට 4.9ක ඍණ වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී ශ්‍රී ලං.ව.අ., ද.ආ.පි.ප. සහ කො.ජ.බ.ප. යන පර්යන්ත තුනෙහිම මුළු භාණ්ඩ හැසිරවීම් ප්‍රමාණය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 9.1ක, සියයට 5.2ක සහ සියයට 0.3ක පහළ යෑමක් පෙන්නුම් කළේය.

- **2020 වසරේ මුල් භාගයේ දී හම්බන්තොට වරායේ සමස්ත භාණ්ඩ සහ රථ වාහන හැසිරවීම් ප්‍රමාණය පහළ ගිය ද, වසරේ දෙවන භාගය ආරම්භයේ සිට භාණ්ඩ හැසිරවීම වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණි.** 2020 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී හම්බන්තොට වරායේ සමස්ත භාණ්ඩ හැසිරවීම් ප්‍රමාණය සියයට 14.6ක වර්ධනයක් පෙන්නුම් කළ අතර, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එහි වර්ධනය සියයට 159.4ක සැලකිය යුතු මට්ටමක පැවතුණි. 2020 වසරේ තෙවන කාර්තුවේ දී හම්බන්තොට වරායේ භාණ්ඩ හැසිරවීම සියයට 66.1ක සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. මේ අතර, 2020 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන මාස නවය තුළ දී හම්බන්තොට වරායේ රථවාහන හැසිරවීම් ප්‍රමාණය සියයට 21.3ක පසුබෑමක් පෙන්නුම් කළ අතර, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී එය සියයට 61.8ක සැලකිය යුතු මට්ටමේ වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ කොළඹ වරාය මගින් සිදු කරන ලද වාහන මෙහෙයවීම් ප්‍රමාණය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, සියයට 71.1ක පහළ යෑමක් පෙන්නුම් කළේය. රජය විසින් මෝටර් රථ සඳහා පනවා ඇති ආනයන පාලනය කිරීමේ ක්‍රියාමාර්ග 2020 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ දක්නට ලැබුණු වාහන හැසිරවීමේ පහළ යෑමට ප්‍රධානම හේතුව විය.

- **කොවිඩ්-19 වසංගතය පැතිර යෑම හේතුවෙන් ඇති වූ බාධා මධ්‍යයේ, මන්දගාමී ස්වරූපයෙන් වුව ද, වරාය අංශයේ ප්‍රධාන සංවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කෙරිණ.** ශ්‍රී ලං.ව.අ., පස්-අවුරුදු සැලසුමකට සමගාමීව, 2025 වසරේ දී පූර්ණ වශයෙන් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂිත නැගෙනහිර බහලු පර්යන්තයේ සහ බස්නාහිර බහලු පර්යන්තයේ සංවර්ධන කටයුතුවල නිරත විය. මෙම එක් එක් පර්යන්තයට වාර්ෂිකව අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 2.4ක් හැසිරවීමේ අංගන ධාරිතාවක් ඇතැයි අපේක්ෂා කෙරෙයි. බස්නාහිර බහලු පර්යන්තය හා සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු සඳහා මූලික ලියවිලි සකස් කිරීම හා ලංසු ඇගයීම් කටයුතු සිදු වෙමින් පැවතුණි. මේ අතර, දැනට පවතින කොළඹ වරායේ උතුරු පසින් කොළඹ උතුරු වරාය ලෙස නව වරායක් සංවර්ධනය කිරීමට ද ශ්‍රී ලං.ව.අ. සැලසුම් කර තිබේ. යෝජිත කොළඹ උතුරු වරාය ද්‍රවීකෘත තොග, වියළි තොග, වාහන

නැව් සහ බහලු මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලං.ව.අ. විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, කොළඹ උතුරු වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීම සඳහා 2020 පෙබරවාරි 20 වන දින AECOM යටිතල පහසුකම් ආයතනය සහ Environment UK සමාගම යන උපදේශක ආයතන සමඟ ගිවිසුමකට අත්සන් තබන ලදී. මේ අතර, කන්කසන්තුරේ වරාය කටයුතු සංවර්ධනය කිරීමට සහ පුළුල් කිරීම සඳහා වරායට යාබද අක්කර 15ක භූමියක් සහ පෞද්ගලික හිමිකාරිත්වයක් සහිත තවත් අක්කර 35ක භූමියක් අත් කර ගැනීමට 2020 පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. 2020 ජූනි මාසයේ දී කන්කසන්තුරේ වරාය පුනරුත්ථාපනය කිරීම සඳහා වූ අවසන් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව ශ්‍රී ලං.ව.අ. වෙත ලැබුණි. මේ අතර, ත්‍රිකුණාමලය වරායේ මෙහෙයුම් ධාරිතාව පුළුල් කිරීමේ අපේක්ෂාවෙන්, නෞකා හුවමාරු ගැඹුර මීටර 13 - 14ක් දක්වා වැඩි වන ආකාරයට දැනට පවතින අෂ්රෆ් ජැටිය මීටර 100කින් දිගු කිරීමට ශ්‍රී ලං.ව.අ. සැලසුම් කරයි. මීට අමතරව, ත්‍රිකුණාමලය වරායේ රාත්‍රී කාලයේ සිදු කරනු ලබන නෞකා හැසිරවීමේ කටයුතු වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ද සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ක්‍රියාත්මක විය. නැව් හැසිරවීමට සහ නවතා තැබීමට බෝයාවන් (navigation and mooring buoys) පිහිටුවීම, රේඩාර් කුලුනක් ඉදි කිරීම, උපපොළක් ඉදිකිරීම, ප්‍රදීපාගාරයේ වෙනස්කම් සිදු කිරීම, විදුලි රැහැන් සැපයීම සහ සවි කිරීම ශ්‍රී ලං.ව.අ. විසින් සාර්ථකව නිම කරන ලදී. මේ අතර, සංචාරක සහ වෙළඳ කටයුතු සඳහා ප්‍රාදේශීය වරායක් ලෙස ගාල්ල වරාය සංවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක විය.

### පණිවුඩ හුවමාරු සේවා

- **විදුලි සංදේශ අංශය 2020 වසරේ මුල් භාගය තුළ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** 2019 වසරේ මුල් භාගයේ අවසානයට සාපේක්ෂව, රැහැන් සහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව 2020 වසරේ මුල් භාගය අවසානය වන විට සියයට 2.0ක වර්ධනයක් වාර්තා කළ අතර, රැහැන් රහිත ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතීම හේතුවෙන්, එහි සියයට 4.6ක අඩු වීමක් වාර්තා විය. ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සමස්ත ස්ථාවර දුරකථන සම්බන්ධතා සංඛ්‍යාවෙහි සියයට 1.1ක සුළු අඩු වීමක් දක්නට ලැබුණි. 2020 වසරේ ජූනි මස අවසානය වන විට ස්ථාවර දුරකථන ඝනත්වය, එනම් පුද්ගලයින් 100කට ඇති දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව 10.6ක් විය. මේ අතර, 2019 වසරේ පළමු හා දෙවන කාර්තුවලට සාපේක්ෂව, 2020 වසරේ පළමු හා දෙවන කාර්තුවල දී ජංගම දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව පිළිවෙළින්, සියයට 2.1කින් සහ සියයට 15.4කින් අඩු විය. විශේෂයෙන්ම, 2020 වසරේ පළමු භාගය අවසන් වන විට ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ඝනත්වය 125.7ක් විය.

- **දිවයින පුරා සංචරණ සීමා පැනවීමත් සමඟ අන්තර්ජාල සේවා භාවිතය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** පුද්ගලයන් තම නිවෙස්වලට සීමා වීමත් සමඟ, කාර්යාලීය, අධ්‍යාපනික සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම් සඳහා අන්තර්ජාල සේවා සඳහා වූ ඉල්ලුම සැලකිය යුතු ලෙස වැඩි විය. මෙම ප්‍රවණතාව පිළිබිඹු කරමින්, 2020 වසරේ පළමු භාගය තුළ දී සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 13.3ක් දක්වා සියයට 10.9කින් වර්ධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ ජූනි මස අවසානය වන විට පැවති 55.0ක් වූ අන්තර්ජාල ඝනත්වයට සාපේක්ෂව, 2020 වසරේ ජූනි මස අවසානය වන විට 60.4ක් දක්වා වර්ධනය විය. ජංගම අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 9.8කින් සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 18.5කින් වර්ධනය වීම මෙම ඉහළ යෑමට හේතු විය. මෙම ප්‍රවණතාවලට අනුකූලව, විශේෂයෙන්, මාර්තු සහ අප්‍රේල් මාස තුළ දී බ්‍රෝඩ්බෑන්ඩ් සේවා දත්ත භාවිතය ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. විශේෂයෙන්ම අධ්‍යාපනික සහ විනෝදාස්වාද කටයුතු සඳහා වැඩිවෙමින් පවතින ඉල්ලුම සපුරාලීම පිණිස, ප්‍රමුඛ පෙළේ සේවා සපයන්නන් විසින් නව්‍ය සහ දැරිය හැකි මිලකට ලබා ගත හැකි දත්ත පැකේජ ලබා දීම නිසා අන්තර්ජාල සේවා භාවිතය අඛණ්ඩව පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් නිකුත් කරන ලද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මිල ප්‍රවණතා පිළිබඳ නවතම වාර්තාවට අනුව, අන්තර්ජාල සේවා ගාස්තු අවම අගයක පවතින රටවල් අතරින් පෙරමුණේම සිටින රටවල් 30 අතරට ශ්‍රී ලංකාව ද ඇතුළත් වී ඇති අතර, ජංගම හඬ, ජංගම දත්ත සහ ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් සේවා සාපේක්ෂව අඩු මිල ගණන්වලට මෙරට දී ලබාගත හැකි බව ද එහි සඳහන් වී ඇත.

3


### 3.5 සංඛ්‍යා සටහන
### විදුලි සංදේශ සේවා

| ග්‍රාහක සංඛ්‍යාව | 2019 ජූනි අවසානය | 2020 ජූනි අවසානය (අ) | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|
| ස්ථාවර දුරකථන ('000) | 2,355 | 2,328 | -1.1 |
| ජංගම දුරකථන ('000) | 32,723 | 27,679 | -15.4 |
| අන්තර්ජාල සම්බන්ධතා ('000) (ආ) | 11,991 | 13,295 | 10.9 |
| ස්ථාවර දුරකථන ඝනත්වය (ඇ) | 10.8 | 10.6 | -2.1 |
| ජංගම දුරකථන ඝනත්වය (ඇ) | 150.1 | 125.7 | -16.3 |

*මූලයන්:* ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ද ඇතුළත්ව
(ඇ) පුද්ගලයින් 100කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව

### 3.9 රූප සටහන
### දුරකථන සම්බන්ධතා (ස්ථාවර හා ජංගම) සහ අන්තර්ජාල සම්බන්ධතා (සංඛ්‍යාව)





*මූලයන්:* ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ශ්‍රී ලංකා මහ බැංකුව

- **ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වර්ධනයට අඛණ්ඩව සහයෝගය දැක්වීය.** 2020 වසරේ මුල් භාගයේ දී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ප්‍රමුඛ පෙළේ විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් නිවසේ සිට වැඩ කිරීම සහ අධ්‍යයන කටයුතු කිරීම සඳහා විශේෂ පැකේජ කිහිපයක් හඳුන්වා දෙන ලදී. තවද, දිවයින පුරා, විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශවල, බාධාවකින් තොරව ඩිජිටල් සේවා ලබාගැනීම සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම පිණිස, ශ්‍රී ලංකාව තුළ සියයට සියයක්ම හතරවන පරම්පරාවේ (4G) / බ්‍රෝඩ්බෑන්ඩ් ආවරණයක් ඇති කිරීම සඳහා *ගමට සන්නිවේදනය ව්‍යාපෘතිය* ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව කටයුතු කළේය. මෙම ව්‍යාපෘතියේ මූලික අදියර රත්නපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට නියමිතය. දැනට භාවිත කරන දුරකථන අංකය නොවෙනස්ව පවත්වා ගනිමින්, සේවා සපයන්නා තෝරා ගැනීමට පරිශීලකයන්ට හැකි වන පරිදි ජංගම දුරකථන අංක භාවිත කිරීමේ පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මූලික පියවර ගෙන ඇත. පිරිවැය කාර්යක්ෂමභාවය සහ සේවාවෙහි කාර්යක්ෂමතාව මත තරග කිරීමට දිරිගන්වමින් ජංගම දුරකථන සේවා ක්‍රියාකරුවන් අතර තරගකාරිත්වය වැඩි කිරීම මෙම ක්‍රියාමාර්ගයෙන් අපේක්ෂා කෙරේ. මේ අතර, මෙරට ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විවිධ ව්‍යාපෘතිවල නිරත විය. ඩිජිටල් රජයක් සහ ඩිජිටල් ආර්ථිකයක් නිර්මාණය කිරීම තුළින් තිරසාර ඩිජිටල් ආර්ථික සංවර්ධනයක් සහ වර්ධනයක් ළඟා කර ගැනීම පිණිස ශ්‍රී ලංකාව සඳහා ජාතික ඩිජිටල් ප්‍රතිපත්ති රාමුව (2020 - 2025 සඳහා ශ්‍රී ලංකාවේ ඩිජිටල් න්‍යාය පත්‍රය) ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ඩිජිටල් අනන්‍යකරණය (ඩිජිටල් හැඳුනුම්පත), ෆින්ටෙක් (බැංකු හා මූල්‍ය ආශ්‍රිත සේවා), සෞඛ්‍ය තාක්ෂණ සහ වෙනත් ඊ-රාජ්‍ය සේවා සහ පුද්ගලික අංශයේ ඩිජිටල්කරණය ඇතුළු වෙනත් අංශ සඳහා මෙම ප්‍රතිපත්ති රාමුව යටතේ මූලික ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නැංවීමට නියමිතය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතන ද, අනෙකුත් අදාළ පාර්ශ්ව සමග එක්ව, කොවිඩ්-19 වසංගත තත්ත්වය සමග 'MyHealth Sri Lanka' සහ 'Contact Tracing' ජංගම යෙදවුම් හඳුන්වාදීම ආදී පියවර කිහිපයක් ගෙන ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් රාජ්‍ය අංශය සඳහා විශ්වාසදායී ලෙස සහ ආරක්ෂිතව වීඩියෝ සම්මන්ත්‍රණ පහසුකම් සැලසීම සඳහා 'meet.gov.lk' වේදිකාව සකස් කළ අතර, ගුවන් තොටුපොළට පැමිණීමට පෙර පූර්ව පැමිණීමේ අවසර ලබා ගැනීම සඳහා වන යෙදවුමක් ද හඳුන්වා දුන්නේය.

- **2020 වසරේ මුල් භාගයේ දී කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ විදුලි සංදේශ සේවා යොදා ගනිමින් සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා රජය විවිධ පියවර ගත්තේය.** ආරක්ෂක අමාත්‍යාංශයේ ඩිජිටල් යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ අංශය, 2020 වසරේ මුල් භාගය තුළ දී ඊ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා ඩිජිටල් ආර්ථික ක්‍රමෝපාය, සිසුන්ගේ හා ගුරුවරුන්ගේ ඩිජිටල් සාක්ෂරතාව වැඩි දියුණු කිරීම සහ අන්තර්ජාල දැනුම්වත්භාවය හා ඩිජිටල්කරණය ප්‍රවර්ධනය යන ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. මේ අතර, මෙරට සයිබර් ආරක්ෂණය පිළිබඳව වගකිවයුතු ආයතනය ලෙස කටයුතු කරන, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය

### 3.10 රූප සටහන
### බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය - 2020




මූලයන්: ඩයලොග් ඇක්සියාටා (පෞද්.) සමාගම
ශ්‍රී ලංකා ටෙලිකොම් (පෞද්.) සමාගම
මොබිටෙල් (පෞද්.) සමාගම
භාර්ති එයාර්ටෙල් ලංකා (පෞද්.) සමාගම

සටහන: පෙටාබයිට් 1 = ගිගාබයිට් මිලියන 1

(Sri Lanka Computer Emergency Readiness Team Coordination Centre - SLCERTCC) විසින් සහතික කිරීමේ සේවා සපයන්නන්ගේ සුමට හා ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රමිතිකරණ ආයතනයක් ලෙස ජාතික සහතික කිරීමේ අධිකාරියක් (National Certification Authority) පිහිටුවන ලදී. රජයේ ඩිජිටල් යෙදවුම් හා ඩිජිටල් යටිතල පහසුකම් වෙත පවතින තර්ජන පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා ජාතික සයිබර් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් පිහිටුවීමට ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය කටයුතු කරමින් සිටියි. මෙම මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතු 2021 වසරේ දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. රජයේ මෙවැනි ක්‍රියාමාර්ග සහ විදුලි සංදේශ යටිතල පහසුකම් හා සම්බන්ධ ශක්තිමත් පදනම හේතුවෙන්, එක්සත් ජාතීන්ගේ ඊ-රාජ්‍ය සංවර්ධන දර්ශකයේ (E-Government Development Index - EGDI) ඉදිරි ස්ථානයකට ගමන් කිරීමට ශ්‍රී ලංකාවට හැකිවිය. ඒ අනුව, 2018 වසරේ දී රටවල් 193ක් අතරින් 94වන ස්ථානයේ රැඳී සිටි ශ්‍රී ලංකාව, 2019 වසරේ දී රටවල් 193ක් අතරින් 85 වන ස්ථානය තෙක් ඉදිරියට පැමිණ තිබේ. රටක ජීවත්වන පුද්ගලයන්ට ඇති පහසුකම් සඳහා ප්‍රවේශය සහ සර්ව සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීමට රටක් විසින් තොරතුරු තාක්ෂණය යොදා ගන්නා ආකාරය මෙම දර්ශකය මඟින් හඳුනා ගැනේ. මංගත සේවා හා තොරතුරුවල ගුණාත්මකභාවය, විදුලි සංදේශ යටිතල පහසුකම්වල ප්‍රමාණවත් බව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීමට මානව සම්පත සතු හැකියාව මෙම දර්ශකයේ ප්‍රධාන නිර්ණායක වේ.

## සමාජ යටිතල පහසුකම් සංවර්ධනය

### සෞඛ්‍යය


- **කොවිඩ්-19 ව්‍යාප්තිය කළමනාකරණය කිරීම සඳහා සෞඛ්‍ය අංශය විසින් ත්‍රිවිධ හමුදාවත්, වෙනත් පාර්ශ්වකරුවනුත් සමඟ එක්ව, පූර්වෝපායික සහ මනා සම්බන්ධීකරණයකින් යුතුව දරන ලද ප්‍රයත්න අගය කළ යුතු වේ.** සෞඛ්‍ය අංශයේ දැනට පවතින සම්පත්වලින් කළමනාකරණය කරගත නොහැකි මට්ටමක් දක්වා කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීම වළක්වා ගැනීම සඳහා අඛණ්ඩ සුපරීක්ෂාකාරී බව සහ සමාජ දුරස්ථකරණ ප්‍රතිපත්ති දැඩිව පිළිපැදීම අත්‍යවශ්‍ය වේ. 2020 ජනවාරි මාසයේ සිට කොවිඩ්-19 වසංගතය වැළැක්වීමට ජාතික ක්‍රියාකාරී කමිටුවක් පිහිටුවීමත් සමඟ, දේශ සීමා හරහා කොවිඩ්-19 වෛරසය රට තුළට ඇතුළු වීමේ හැකියාව පිළිබඳව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශය සුපරීක්ෂාකාරීව පසු විය. ඒ අනුව, පිවිසුම් තොටවලින් පැමිණෙන මගීන් පරීක්ෂා කිරීම හා ආවේක්ෂණය මෙන්ම සෞඛ්‍ය ප්‍රකාශන පෝරම (ආකෘති පත්‍ර) හරහා මගීන්ගේ තොරතුරු එක් රැස් කිරීම 2020 ජනවාරි අවසාන භාගයේ සිට ආරම්භ කෙරුණි. ශ්‍රී ලංකාව තුළ පළමු දේශීය ආසාදිත පුද්ගලයා 2020 මාර්තු 11 වන දින වාර්තා විය. දේශීය වශයෙන් කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය සඳහා වූ ප්‍රතිචාර බහුවිධ මුහුණුවරකින් යුතු වූ අතර, එය පාර්ශ්වයන් ගණනාවකගේ සහාය ඇතිව සෞඛ්‍ය අංශයේ නායකත්වය යටතේ සිදු විය. ගෝලීය වශයෙන් වසංගතය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමත් සමඟ, 2020 මාර්තු 19 වන දින සිට මගීන් රට තුළට ඇතුළුවීම සඳහා සීමා පැනවීමට ශ්‍රී ලංකාවට සිදු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකික සිසුන්, ශ්‍රමිකයන්, යැපෙන්නන් සහ වන්දනාකරුවන් මෙරටට ගෙන්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය අඛණ්ඩව කටයුතු කළ අතර, එසේ පැමිණි පසුව ඔවුන් දින 14ක අනිවාර්ය නිරෝධායන කාලයක් සඳහා යටත් කෙරුණි. වෛරසය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා 2020 මාර්තු මැද සිට මුළු රට පුරාම ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීමට පියවර ගනු ලැබීය. අප්‍රේල් අවසානයේ සිට සංචරණය සඳහා පනවා තිබූ සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කළ අතර, වෛරසය පැතිරීමේ අවදානම සහ පැතිරීමේ ප්‍රමාණය පදනම් කර ගනිමින් සමහර ප්‍රදේශ කෙටි කාලපරිච්ඡේද සඳහා හුදකලා කිරීම සිදු කරන ලදී. වෛරසය ආසාදනය වීමේ අවදානමක් සහිත එම ප්‍රදේශවල ජීවත් වන පුද්ගලයින් නම් කරනු ලැබූ නිරෝධායන මධ්‍යස්ථානවල නිරෝධායනය කිරීම හෝ ඔවුන්ගේ නිවාසවලම ස්වයං නිරෝධායනය

3

කිරීම සඳහා කටයුතු කෙරුණි. විශ්වවිද්‍යාල මෙන්ම පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව දීප ව්‍යාප්තව කොවිඩ්-19 පරීක්ෂණ පහසුකම් ශක්තිමත් කිරීමට මෙම කාලපරිච්ඡේදය මුළුල්ලේම කටයුතු කරන ලදී. රෝගීන් යැයි සැක සහිත පුද්ගලයන් මෙන්ම වෛරසය ආසාදනය වූ පුද්ගලයන්ගේ ආශ්‍රිතයන්, ඉහළ අවදානම් ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් සහ ප්‍රජා සම්ප්‍රේෂණය සඳහා ඉහළ අවකාශ සහිත කොට්ඨාශ වැනි වෛරසය ආසාදනය වීම සඳහා ඉහළ අවදානමක් සහිත පුද්ගලයින් සඳහා තෝරා ගැනීමේ ක්‍රමවේදයක් භාවිත කරමින් කොවිඩ්-19 පරීක්ෂණ සිදු කරන ලදී. අහඹු පරීක්ෂණ ද අඛණ්ඩව සිදු කරන ලදී. 2020 මැද භාගයේ සිට ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ, ජනතාවගේ සෞඛ්‍ය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා මෙන්ම, වසංගතය ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා මාර්ගෝපදේශ ගණනාවක් නිකුත් කරන ලදී. ආසාදනය වූවන් කළමනාකරණය සඳහා වූ පූර්වෝපායික ක්‍රියාමාර්ගවලට අමතරව, සමාජ දුරස්ථකරණ ප්‍රතිපත්ති හා අදාළ අනෙකුත් සෞඛ්‍ය මාර්ගෝපදේශන දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සහ සෞඛ්‍ය සේවා පද්ධති ධාරිතාවය ශීඝ්‍රයෙන් වැඩිදියුණු කිරීම හේතුවෙන් 2020 සැප්තැම්බර් අවසානය දක්වා වසංගත වක්‍රය බොහෝදුරට පැතලි මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. 2020 ඔක්තෝබර් 04 වැනි දින සිට නව කොවිඩ්-19 පොකුරු හඳුනා ගැනීමත් සමඟ කොවිඩ්-19 රෝගීන් වාර්තා වීමේ ශීඝ්‍ර වැඩි වීමක් වාර්තා වූ අතර, එමගින් කොවිඩ්-19 නව පොකුරු ඇති වීමේ හැකියාව පිළිබඳව සුපරීක්ෂාකාරීව පසු වෙමින් පෞද්ගලික ආරක්ෂක පියවර සහ සමාජ දුරස්ථකරණ පියවර අඛණ්ඩව පිළිපැදීමේ වැදගත්කම අවධාරණය කෙරේ. මෑත කාලීන කොවිඩ් පොකුරු හඳුනා ගැනීමත් සමඟ, සැක සහිත රෝගීන් නිරෝධායනය කිරීම හා කොවිඩ්-19 රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා පවතින පහසුකම් ඉහළ නංවන අතරම, කොවිඩ්-19 සඳහා වූ පී.සී.ආර්. පරීක්ෂණ ශීඝ්‍රයෙන් වැඩි කිරීම සඳහා රජය විසින් ගෙන ඇති කාලීන ක්‍රියාමාර්ග ද මෙහි දී සඳහන් කළ යුතුය. 2020 ඔක්තෝබර් 23 දින ප.ව. 10.00 වන විට, කොවිඩ්-19 වැළඳුන රෝගීන්ගේ මුළු සංඛ්‍යාව 6,287ක් වූ අතර, සුව වූ රෝගීන් සංඛ්‍යාව සහ කොවිඩ්-19 හේතුවෙන් වාර්තා වූ මරණ සංඛ්‍යාව, පිළිවෙළින් 3,644ක් සහ 14ක් විය. මෙමගින්, පුද්ගලයින් මිලියනයක් සඳහා කොවිඩ්-19 වැළඳුන රෝගීන් සංඛ්‍යාව 285ක්, සුවවීමේ ප්‍රතිශතය සියයට 58.0ක් සහ මරණ ප්‍රතිශතය සියයට 0.2ක් බව නිරූපණය කෙරේ.

**3.11 රූප සටහන**

**තහවුරු කරන ලද කොවිඩ් - 19 රෝගීන් සංඛ්‍යාව සහ සිදු කරන ලද පී සී ආර් පරීක්ෂණ සංඛ්‍යාව (2020 ඔක්තෝබර් 23 දින දක්වා දෛනික අගය)**




*මූලය:* සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

- **කොවිඩ්-19 වසංගත බලපෑම හැරුණු කොට, වෙනත් බෝවන රෝග කිහිපයක ව්‍යාප්තිය පාලනය සඳහා ද ශ්‍රී ලංකාවට කටයුතු කිරීමට සිදු විය.** වසර තුනකට අධික කාලයක් තුළ රුබෙල්ලා සහ සරම්ප යන වෛරස දෙකෙහි දේශීය වශයෙන් සම්ප්‍රේෂණයක් පිළිබඳව කිසිදු වාර්තාවක් නොමැති වීමත් සමඟ, ශ්‍රී ලංකාව සරම්ප සහ රුබෙල්ලා සාර්ථකව තුරන් කළ රටක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් 2020 ජූලි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. රජයේ ප්‍රමුඛත්වයෙන් සිදුවන ප්‍රතිශක්තිකරණ වැඩසටහන් සහ මනාව ක්‍රියාවට නැංවෙන ආවේක්ෂණ පද්ධතිය හේතුවෙන් මෙම සාර්ථකත්වය ළඟා කර ගැනීමට හැකිවී ඇත. සංචරණ සීමා පැනවීම සහ සමාජ දුරස්ථකරණ ක්‍රියාමාර්ග හේතුවෙන්, 2020 වසරේ පළමු භාගය තුළ දී ඉන්ෆ්ලුවෙන්සා රෝගයේ සාමාන්‍ය ඍතුමය රටාව දක්නට නොලැබුණි. තවද, 2012 වසරේ දී තුරන් කරන ලද මැලේරියා රෝගය දේශීය වශයෙන් නැවත මතුවීම වළක්වා ගැනීම සඳහා ආවේක්ෂණ සහ පූර්වෝපායිකව රෝගීන් කළමනාකරණ ක්‍රියාකාරකම් සිදු කරගෙන යන ලදී. ඒ අනුව, පිට රටක දී මැලේරියා වැළඳීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ දී හඳුනාගත් මැලේරියා රෝගීන් සංඛ්‍යාව වසරේ පළමු භාගයේ දී 21ක් පමණක් විය. මේ අතර, ආර්ථික හා සාමාජීය ක්‍රියාකාරකම් සීමා කිරීමට ගත් පියවර සමඟ, පුද්ගලයින්ට තම වටාපිටාව පිරිසිදු කිරීමට හා නඩත්තු කටයුතු කිරීමට ඉඩ ප්‍රස්ථා ලැබීමෙන් මදුරුවන් බෝවෙන ස්ථාන නිර්මාණය වීම වැළැකී යෑම හේතුවෙන් ඩෙංගු වසංගතය කිසියම් දුරකට පාලනය වීමක් සිදුව ඇත. ඒ අනුව, වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළ දී වාර්තා වී ඇති ඩෙංගු උණ සහිත සමස්ත

රෝගීන් සංඛ්‍යාව 26,734ක් වන අතර, එය පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 40.4ක පහළ යැමකි. 2019 වසරේ අවසාන භාගයේ දී ආරම්භ වූ ඩෙංගු ව්‍යාප්තිය 2020 වසරට ද ව්‍යාප්ත වූ අතර, 2020 වසරේ දී හඳුනාගත් රෝගීන්ගෙන් බහුතරයක් ජනවාරි මාසය තුළ දී හඳුනාගෙන ඇත. මෙම සංඛ්‍යාව ක්‍රමයෙන් පහළ යමින්, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීමත් සමඟ ඩෙංගු රෝගීන් වාර්තා වීමේ සැලකිය යුතු අඩු වීමක් සිදු වූ අතර, 2020 මාර්තු මැද සිට මැයි මැද දක්වා කාලය තුළ දී ක්‍රියාත්මක වූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබූ කාලය තුළ නිවෙසින් නිවෙසට ගොස් මදුරුවන් පාලනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක නොවූව ද, 2020 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ ඩෙංගු රෝගීන් ප්‍රමාණය 493ක් පමණක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. කෙසේ වෙතත්, අත්හැර දැමූ හා නවතා දැමූ වැඩ බිම් සහ වසා තැබූ පාසල් හා ආයතනවල රෝග වාහකයින් පාලනය කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, 2020 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ මී උණ වැළඳී රෝගීන් සංඛ්‍යාවේ ඉහළ යැමක් දක්නට ලැබුණි. ඒ අනුව, පසුගිය වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී සියයට 66.0ක ඉහළ යැමක් වාර්තා කරමින් 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ දී මී උණ වැළඳී රෝගීන් 5,289ක් වාර්තා විය. ඉහළ රෝගීන් සංඛ්‍යාවක් රත්නපුර, කළුතර සහ ගාල්ල දිස්ත්‍රික්කවලින් වාර්තා විය. ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම හේතුවෙන් 2020 අප්‍රේල් මාසයේ දී ළමුන් එන්නත් කිරීමේ වැඩසටහන් තාවකාලිකව නවතා දැමීමට සිදු වුව, ද මෙම සේවා අප්‍රේල් මාසය අවසානයේ දී කලින් වේලාවක් වෙන් කරවා ගත් පදනමින් පමණක් ක්‍රියාත්මක වන ක්‍රමයක් යටතේ නැවත ආරම්භ කරන ලදී. ප්‍රමාද වූ එන්නත් කිරීමේ වැඩසටහන්වලින් බහුතරයක් මැයි මස මැද භාගය වන විට අවසන් කිරීමට කටයුතු කරන ලදී.

- **කොවිඩ්-19 ව්‍යාප්තිය හා බැඳුණු අභියෝගතා මධ්‍යයේ, ජනගහනයේ මරණ සහ රෝගාතුර තත්ත්ව කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු සාධක වන දියවැඩියාව, නිදන්ගත ශ්වසන රෝග, නිදන්ගත වකුගඩු රෝගය (CKD), පිළිකා සහ හෘද රෝග වැනි බෝ නොවන රෝග පිළිබඳව අඛණ්ඩව කටයුතු කිරීමට ද සෞඛ්‍ය පද්ධතියට සිදු විය.** රට තුළ උග්‍ර සහ නිදන්ගත බෝ නොවන රෝග පාලනය කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්, පරීක්ෂණ හා ආවේක්ෂණ, සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ අවදානම අඩු කිරීමේ ක්‍රියාමාර්ග ගණනාවක් සැලසුම් කර තිබුණ ද, වසංගතය මැඩ පැවැත්වීම සඳහා ඉහළ අවධානයක් යොමු කිරීම හේතුවෙන්, මෙම ක්‍රියාමාර්ගවලට අදාළව 2020 වසරේ පළමු භාගය තුළ දී සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට නොහැකි විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 හා සම්බන්ධව අදාළ සීමා පැනවීම් මධ්‍යයේ දී වුව ද, රජයේ සහ පෞද්ගලික අංශයේ රෝහල් හරහා දිගුකාලීනව සෞඛ්‍ය සේවාවන් ලබන බෝ නොවන රෝග සහිත රෝගීන්ට ඖෂධ සැපයීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී. තැපැල් සේවාව හරහා ඖෂධ සැපයූ අතර, බෝ නොවන රෝග සහිත රෝගීන් සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය වෙත තාක්ෂණික මාර්ගෝපදේශනය ලබා දීම සිදු විය. සෞඛ්‍යාරක්ෂිත ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය වැඩසටහන් ද දියත් කරන ලදී.

- **කොවිඩ්-19 වසංගතය වැළැක්වීමේ අරමුණින් රජයේ සෞඛ්‍ය අංශය විසින් 2020 වසරේ පළමු භාගයේ දී භෞතික හා මානව සම්පත් වැඩිදියුණු කරන ලදී.** 2020 ජූනි මාසය අවසන් වන විට, සුදුසුකම්ලත් වෛද්‍යවරුන් 18,041ක් සහ හෙද සේවයේ නියුතු වූවන් 38,569ක් සේවය කළ අතර, එම සංඛ්‍යා පුද්ගලයන් 1,221කට එක් වෛද්‍යවරයෙක් හා පුද්ගලයන් 571කට එක් හෙද සේවකයෙකු බැගින් පෙන්නුම් කරයි. මේ අතර, රජයේ රෝහල්වල තිබූ මුළු ඇඳන් ගණන 78,526ක් වූ අතර, එය පුද්ගලයන් 1,000කට ඇඳන් 3.6ක් හා සමාන විය. 2020 ජූනි මාසය අවසන් වන විට ආයුර්වේද වෛද්‍යවරු 25,807ක් ද, ඇඳන් 5,062ක ධාරිතාවකින් යුතු ආයුර්වේද රෝහල් 118ක් ද විය. 2020 වසරේ පළමු භාගය අවසන් වන විට රට පුරා දළ වශයෙන් දැඩිසත්කාර සඳහා වූ ඇඳන් 775ක් පැවතුණි.

- **වසංගත කාලපරිච්ඡේදය තුළ, පෞද්ගලික අංශය මගින්, විශේෂයෙන් ම කොවිඩ් නොවන රෝගවලට අදාළව වැදගත් කාර්ය භාරයක් අඛණ්ඩව ඉටු කරන ලදී.** 2020 ජූනි මාසය අවසන් වන විට, ලියාපදිංචි පෞද්ගලික රෝහල් 209ක් පැවති අතර, ඒ සියල්ලෙහි ධාරිතාවය ඇඳන් 5,099ක් විය. 2020 ජූලි අවසානය වන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන කවුන්සිලය යටතේ පූර්ණ කාලීන සාමාන්‍ය වෛද්‍ය සේවා/බෙහෙත් ශාලා/වෛද්‍ය සායන 128ක්, වෛද්‍ය විද්‍යාගාර 156ක්, පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන/පරීක්ෂණ මධ්‍යස්ථාන/දිවා සුරැකුම් වෛද්‍ය මධ්‍යස්ථාන/විශේෂඥ වෛද්‍ය සේවා මධ්‍යස්ථාන 80ක් සහ අර්ධ කාලීන පෞද්ගලික සාමාන්‍ය වෛද්‍ය සේවා/බෙහෙත් ශාලා/වෛද්‍ය

3

සායන 216ක් ලියාපදිංචි වී තිබුණි. මේ අතර, කොවිඩ්-19 රෝගීන් සහ කොවිඩ්-19 වැළඳී ඇතැයි සැක කෙරෙන රෝගීන් සායනික වශයෙන් කළමනාකරණය සම්බන්ධයෙන් පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. සංචරණ සීමා සහ පුද්ගල දුරස්ථකරණ මාර්ගෝපදේශ මධ්‍යයේ රෝගීන්ගේ වෛද්‍ය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් යුතුව, එම අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රධාන පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් නව්‍ය ක්‍රමවේද යොදා ගන්නා ලදී. මංගත ක්‍රමවලට රෝග පූර්ව පරීක්ෂණ පහසුකම් සැපයීම, දුරකථන මාර්ග පද්ධති හරහා (Telemedicine) වෛද්‍ය උපදෙස් සැපයීම සහ විද්‍යුත් මාධ්‍යයෙන් ඉදිරිපත් කෙරෙන ඖෂධ වට්ටෝරු සඳහා ඖෂධ සැපයීම මෙයට ඇතුළත් විය.

## අධ්‍යාපනය

- **පළාත් අධ්‍යාපන අධිකාරීන් සහ ජාතික මට්ටමේ ආයතනවල සහයෝගීතාවයෙන් යුතුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2020 - 2025 කාලපරිච්ඡේදය සඳහා මැදි කාලීන උපායමාර්ගික සැලසුමක් සකස් කර ඇත.** මෙම උපායමාර්ගික සැලසුම මගින් සාමාන්‍ය අධ්‍යාපනික අවස්ථාවන්ගේ සාධාරණත්වය, ගුණාත්මක බව, කාර්යක්ෂමතාවය, සඵලදායීත්වය, අදාළත්වය සහ ප්‍රමාණාත්මකභාවය හා සබැඳි පද්ධතිමය ගැටලු විසඳාලීමට අපේක්ෂිතය. 'වසර 13ක අනිවාර්ය අධ්‍යාපන වැඩසටහන' පාසල් 421ක් ආවරණය වන පරිදි පුළුල් කරන ලද අතර, ආයතනවලට අනුයුක්ත කර ඇති සිසුන්ට, ඔවුන්ගේ පැමිණීම පදනම් කර ගනිමින්, රුපියල් 500ක මූල්‍ය අනුග්‍රහයක් ප්‍රදානය කරන ලදී. මෙම වැඩසටහන මගින් කුසලතා පිරි ශ්‍රමිකයන් නිර්මාණය කිරීම අරමුණු කර ඇති හෙයින්, පාසලේ ගත කරන කාලය අඩු කර, වෘත්තීය පුහුණු ආයතන මගින් ලබා දෙන රැකියාවෙහි නිරතවන අතරතුර පුහුණුව ලබන කාලය ඉහළ නංවමින් මෙම වැඩසටහනේ ආකෘතිය වෙනස් කිරීමට මූලික පියවර ගෙන ඇත. එසේම, ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අධ්‍යාපනයේ ඵලයන්ගේ සමස්ත ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා විෂය මාලා සකස් කිරීමට හා ප්‍රතිසංස්කරණවලට අදාළ මූලික පියවර ගෙන ඇති අතර, පවතින අධ්‍යාපන ක්‍රමයේ අදාළ අංශ විද්‍යා, තාක්ෂණික, ඉංජිනේරු හා ගණිතය (STEM) මූලික කරගත් ප්‍රවේශයක් වෙත අනුගත කිරීමට කටයුතු කරන ලදී.

- **කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් මාර්තු මස මැද භාගයේ සිට වරින් වර පාසල් වසා තැබීමට සිදුවීම තුළින් අධ්‍යාපනික කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී තිබේ.** වසංගතයෙන් දරුවන් ආරක්ෂා කිරීමට ගන්නා ලද කඩිනම් පියවරක් ලෙස රජය විසින් පාසල් වැසීම අගය කළ යුතු වුව ද, අධ්‍යාපන කටයුතු සඳහා ඇති වූ අවහිරතා හේතුවෙන් සිසුන්ගේ ඉගෙනීමේ ක්‍රියාවලිය මත දිගුකාලීන බලපෑමක් ඇති වීමේ හැකියාවක් පවතී. මෙම අවහිරතා මගින් ඉගෙනීමේ අපහසුතා ඇති සිසුන් සහ අධ්‍යාපනික හෝ සමාජ ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් පසුබිමකින් එන සිසුන් වෙත වැඩි බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එවැනි සිසුන්ට දුරස්ථ ඉගෙනුම් උපාය මාර්ග තුළින් ප්‍රමාණවත් පරිදි ප්‍රතිලාභ ලැබීමට නොහැකි විය හැක. කිසියම් දුරකට හෝ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමේ ප්‍රයත්නයක් ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිසුන් සඳහා ක්‍රියාකාරකම් පත්‍ර සැපයීමට හා මංගත මාධ්‍ය ඔස්සේ දුරස්ථ ඉගෙනීම් පංති පැවැත්වීම සඳහා පාසල් අඛණ්ඩව දිරිමත් කරන ලදී. වර්තමානයේ දී, සිසුන්ට නිවසේ සිට අඛණ්ඩව ඉගෙනීම සඳහා පහසුකම් සැපයීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික විද්‍යුත් - ඉගෙනුම් දොරටුව වන *ඊ-තක්සලාව* හරහා 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා අදාළ වන ඉගෙනුම් ආධාරක සැලකිය යුතු ප්‍රමාණයක් ලබාදෙයි. අධ්‍යාපන අමාත්‍යාංශය, අදාළ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව, අධ්‍යාපනය සඳහාම වෙන්වූ රූපවාහිනී නාලිකා ඔස්සේ සිංහල හා දෙමළ යන භාෂා ද්විත්වයෙන්ම අධ්‍යාපනික වැඩසටහන් කිහිපයක් විකාශය කළ අතර, ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව උසස් පෙළ හා සාමාන්‍ය පෙළ සිසුන් සඳහා නව රූපවාහිනී නාලිකාවක් දියත් කළේය. පාසල් නැවත විවෘත කිරීමට පෙර සුරක්ෂිත ඉගෙනුම් වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා විෂබීජහරණය, අත් සේදීම සඳහා ජලය සැපයීම, පංති කාමර සැකසීම සහ අනෙකුත් අදාළ අංශ සම්බන්ධයෙන් කොවිඩ්-19 වැළැක්වීම සඳහා වැදගත් වන පියවර පිළිබඳ මාර්ගෝපදේශ සපයන ලදී. එසේම, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 'ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන අංශය තුළ කොවිඩ්-19 ව්‍යාප්තිය මගින් ඇති කෙරෙන අවහිරතා අවම කිරීම පිණිස හදිසි තත්ත්වයන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම' සකස් කරන ලදී. නිවසේ සිටම අධ්‍යාපනය ලැබීමට පහසුකම් සැපයීම, පාසල් තුළ විද්‍යුත් ඉගෙනුම් හා ස්වයං - ඉගෙනුම් පහසුකම් ප්‍රවර්ධනය කිරීම, විද්‍යුත් හා දුරස්ථ ඉගෙනුම් ක්‍රම සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ

වෘත්තීය ශක්‍යතාව ශක්තිමත් කිරීම, සුරක්ෂිත හා සෞඛ්‍යාරක්ෂිත පාසල් වටපිටාවක් නිර්මාණය කිරීම සහ විශේෂයෙන්ම, අවදානම් විශ්ලේෂණ හා හදිසි ප්‍රතිචාර සම්බන්ධයෙන් පුළුල් සැලැස්මක් සහ අදාළ හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර ඒකක ගොඩනැගීම පිළිබඳව මෙම සැලසුම මගින් අවධානය යොමු කෙරේ. ගුරුවරුන්, සිසුන් සහ අදාළ බලධාරීන් විසින් මංගත ඉගෙනුම් ක්‍රියාවලිය භාවිතා කළ නමුත්, තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් සඳහා ඇති ප්‍රවේශයෙහි පවතින විෂමතා, ඉගැන්වීම සඳහා ඉලෙක්ට්‍රොනික උපාංග භාවිත කිරීම සඳහා ගුරුවරුන් සතු හැකියාවන් සීමා සහිත වීම සහ මිශ්‍ර ක්‍රමවේදයන්ගෙන් යුතු ඉගෙනුම් ප්‍රවේශයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම පිණිස යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලිව ඉස්මතු විය.

- **2020 වසරේ මාර්තු මාසයේ මැද භාගයේ සිට විශ්වවිද්‍යාල වරින් වර වසා තැබුණ ද, විශ්වවිද්‍යාල සහ අනෙකුත් ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ එක්ව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දුරස්ථ ඉගෙනුම් පද්ධති හරහා අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යන ලදී.** විශ්වවිද්‍යාල වසා තැබූ කාලපරිච්ඡේදය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාල විසින් යොදාගනු ලබන මිශ්‍ර ක්‍රමවේදයන්ගෙන් යුතු ඉගෙනුම් පද්ධතියෙහි අංගයක් වන ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා මංගත ඉගෙනීම් වෙත යොමු වීමට සියලුම විශ්වවිද්‍යාල පාහේ වහා පියවර ගත්තේය. ඒ අනුව, මාර්තු මස අවසානයේ සිට අගෝස්තු මස අවසානය දක්වා කාලය තුළ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය හරහා ආසන්න වශයෙන් ඉගෙනුම් සැසි 160,000ක් පමණ පවත්වා ඇති බවත්, එම පද්ධතිය සඳහා පරිශීලකයන්ගේ සමස්ත ප්‍රවේශවීම් ප්‍රමාණය මිලියන 6.7ක් පමණ වන බවත් ඇස්තමේන්තුගත කර ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සිසුන් එවැනි අධ්‍යාපනික තාක්ෂණ භාවිතය වෙත ඉක්මනින්ම යොමුවීම සහ ඒ සඳහා ඔවුන් තුළ පැවති උනන්දුව අගය කළ යුතු වේ. සාමාන්‍ය අධ්‍යාපන අංශයේ දක්නට ලැබූ පරිදිම, උපාංග හා අන්තර්ජාල පහසුකම්වලට අදාළ යටිතල පහසුකම්වල පවතින ඌනතාවය හේතුකොටගෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යයන් හා පීඨවල සාමාජිකයන් විසින් ද විද්‍යුත් - ඉගෙනුම් පද්ධති වෙත ප්‍රවේශවීමට අදාළව මුහුණ දුන් දුෂ්කරතා පිළිබඳව වාර්තා කර ඇත. ඒ අනුව, ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් මුහුණ දුන් ඉහත සඳහන් කළ යටිතල පහසුකම් ඌනතා ගැටලුවලට විසඳුම් ලබා දෙන අතරම, මංගත ඉගෙනුම් ක්‍රියාවලියට ගැලපෙන පරිදි සියලුම දේශන වෙනස් කිරීම සඳහා මූලික පියවර ගනිමින් පවතී. රජයේ සංවර්ධන සැලැස්ම අනුව යමින්, දිස්ත්‍රික්ක 10ක් තුළ එම දිස්ත්‍රික්ක සඳහාම ආවේනික සංවර්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා 'නගර විශ්වවිද්‍යාල' ස්ථාපිත කිරීමට නියමිතය. එසේම ආර්ථිකයේ වර්ධනය වන අවශ්‍යතා සපුරාලීම පිණිස වෙනත් විශේෂ රාජ්‍ය විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීම සඳහා සාකච්ඡා ක්‍රියාත්මකය. නව පීඨයන්, දෙපාර්තමේන්තු, උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් ස්ථාපිත කිරීම සඳහා අවසර ලබාදීම හරහා රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබා දීමේ ධාරිතාව පූර්වෝපායිකව ඉහළ නැංවීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අඛණ්ඩව කටයුතු කළේය. දිගින් දිගටම ගැටලුවක්ව පවතින නවක වධය සඳහා විසඳුම් ලබා දීමේ අරමුණින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා සන්නිවේදන දොරටු අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, අලුතින් ඇතුළත් වන සිසුන් සඳහා හැඩගැස්වීමේ වැඩසටහන් සහ නවක වධය පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළේය. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවක වධය සහ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ භාවය හා සබැඳි හිංසා පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් දැනට සිදු කෙරෙමින් පවතී.

- **පෞද්ගලික අංශය විසින් රජය සමඟ එක්ව තෘතියික අධ්‍යාපනය සැපයීම සඳහා අඛණ්ඩව පූර්වෝපායික ලෙස කටයුතු කරන ලදී.** 2020 ජූනි මස අවසානය වන විට, උපාධි පිරිනමන ආයතන ලෙස හඳුනාගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 19ක් පැවති අතර, ඒවා මගින් පිරිනමනු ලැබූ දේශීයව පිළිගනු ලබන උපාධි පාඨමාලා සංඛ්‍යාව 160කි. 2020 වසරේ පළමු භාගය තුළ දී, උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනයක් අලුතින් පිළිගන්නා ලද අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් පිරිනමනු ලබන නව උපාධි පාඨමාලා 14ක්ද හඳුනාගනු ලැබීය. මීට අමතරව, නව පාඨමාලා කිහිපයක් දැනට සමාලෝචනය කෙරෙමින් පවතී. 'තත්ත්ව සහතික සහ ප්‍රතීතන කොමිෂන් සභාව' ස්ථාපිත කිරීම සඳහා නෛතික රාමුවක් සකස් කිරීමේ අරමුණින් යුතුව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නීති කෙටුම්පත් සම්පාදනය කළ අතර, කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එය

3

ගැසට් පත්‍රයක් මගින් නිවේදනය කරන ලදී. තවද, පාර්ශ්වකරුවන් විසින් අවධාරණය කරනු ලැබූ කරුණු කිහිපයක් සලකා බලමින්, උපාධි පිරිනමනු ලබන ආයතන සඳහා වූ අවම ප්‍රමිතීන් නියම කරමින් මාර්ගෝපදේශයක් සකස් කිරීම සඳහා 2019 වසරේ දී විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. මෙම විශේෂඥ කමිටුවේ නිර්දේශ, ප්‍රතීතන හා තත්ත්ව සහතික කිරීම පිළිබඳ ස්ථාවර කාරක සභාව මගින් විමර්ශනය කිරීමට නියමිතය. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ලියාපදිංචිය හා නියාමනයට අදාළ සංශෝධිත පත්‍රිකාව, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය ලැබීම සඳහා කලාපය තුළ ඇති ඉල්ලුමෙන් ඵල ලැබීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට සහාය වීමේ ප්‍රයත්නයක් ලෙස, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හදාරන ජාත්‍යන්තර සිසුන්ට පහසුකම් සැලසීමට සහ නියාමනය කිරීමට ජාත්‍යන්තර සිසුන් සඳහා වීසා ප්‍රතිපත්තියක් ද සකස් කෙරෙමින් පවතී.

- **කුසලතා සම්බන්ධයෙන් ආර්ථිකයේ පවතින කාලීන අවශ්‍යතා පිළිබඳව නිසි සැලකිල්ල දක්වමින්, ශ්‍රම බලකායෙහි කුසලතා පදනම වැඩිදියුණු කිරීම සඳහා කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය විසින් සිය ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යන ලදී.** වසරේ පළමු භාගය අවසානය වන විට, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය යටතේ ආයතන 1,334ක් ලියාපදිංචි වී පැවතුණි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් 40කට වැඩි ප්‍රමාණයක් සඳහා නව ජාතික නිපුණතා ප්‍රමිතීන් සකස් කර ඇති අතරම, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් 10කට වැඩි ප්‍රමාණයක් සඳහා ඉහත ප්‍රමිතීන් සංශෝධනය කරන ලදී. කොවිඩ්-19 ව්‍යාප්තියත් සමඟ, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් මංගත පාඨමාලා සපයන පුහුණු ආයතන ලියාපදිංචිය සඳහා ඇගයුම් නිර්ණායක සකස් කරන ලද අතර, සිසුන්ගේ පුහුණු කාර්යසාධනය පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා මංගත පද්ධතියක් ද සකස් කෙරුණි. මංගත සම්මන්ත්‍රණ (Webinar) සැසි පැවැත්වීමට අමතරව, මෙම කාලපරිච්ඡේදය තුළ දී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, රූපවාහිනී නාලිකා සමග ඒකාබද්ධ වෙමින් විෂය ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින් වෘත්තීය පුහුණුවන්නන් සඳහා පාඩම් මාලා විකාශය කිරීමට කටයුතු කළේය. කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි ගුණාත්මක බව සහ අදාළ බව වැඩිදියුණු කිරීමට වන අඛණ්ඩ කැපවීම රජයේ වර්තමාන ප්‍රතිපත්ති දිශානතිය මගින් සහතික වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## නිවාස සහ නාගරික සංවර්ධනය

- **කොවිඩ්-19 වසංගත කාලය තුළ පැන වූ සංචරණ සීමා හේතුවෙන් 2020 වසරේ පළමු භාගය තුළ දී නිවාස සහ නාගරික සංවර්ධන කටයුතු සඳහා අවහිරතා ඇති විය.** රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව යමින්, ජාතික නිවාස සහ සංවර්ධන අධිකාරිය විසින් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහා එක් අඩු ආදායම්ලාභී පවුලක් බැගින් හඳුනාගනිමින් ඔවුන්ට නිවසක් ලබා දීමේ වැඩසටහනක් වන ඔබට ගෙයක් රටට හෙටක් යන නිවාස වැඩසටහන ආරම්භ කරන ලදී. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ, පවුලක් සඳහා රුපියල් 600,000ක ප්‍රදානයක් ලබා දීම හරහා නිවාස ඒකක 14,022ක් ඉදිකිරීමට නියමිතය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමග මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම මන්දගාමී වී ඇති අතර, 2020 වසරේ පළමු භාගය තුළ දී නිවාස ඒකක 288ක් පමණක් සම්පූර්ණ කර ඇත. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී කොළඹ නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය සහ මැදි ආදායම් නිවාස ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක විය. තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට ක්‍රියාත්මක කර ඇති බේරේ වැව සංවර්ධන ව්‍යාපෘතියට සහ පදිකයන් සඳහා ඇවිදින මංතීරු සංවර්ධන ව්‍යාපෘතියට අමතරව, නගර අලංකරණ ව්‍යාපෘතීන් දෙකක් ආරම්භ කරන ලදී. ඒ අනුව, ගාලු මුවදොර සංවර්ධන ව්‍යාපෘතිය සහ කොළඹ 01හි පදිකයන් සඳහා පහසුකම් සපයන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය වර්තමානයේ ක්‍රියාවට නැංවෙමින් පවතී. 2019 වසරේ දී ක්‍රියාත්මක වෙමින් පැවති බේරේ වැව සහ උත්තරානන්ද මාවත ආශ්‍රිත පදිකයන් සඳහා වූ ඇවිදින මංතීරු සංවර්ධන ව්‍යාපෘති මෙම වසර තුළ දී සම්පූර්ණ කරන ලදී.

- **මන්දගාමී ස්වරූපයෙන් යුතුව වුව ද, 2020 වසරේ පළමු භාගය තුළ දී කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක විය.** 2020 වසර අවසානය වන විට, ව්‍යාපෘති සමාගම විසින් අභ්‍යන්තර උපයෝගිතා යටිතල පහසුකම් සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. භූමි අලංකරණ කටයුතු ආරම්භ වූ අතර, එම කටයුතු 2021

වසර වන විට අවසන් වීමට නියමිතය. වරාය නගරය ආශ්‍රිත ඉදිකිරීම් කටයුතු, ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තිබූ කාලය තුළ ඇණහිට තිබූ අතර, එම ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්ව ඇත.

## ජල සම්පාදනය

- **ඉදිරි වසර කිහිපය තුළ දී සියලු ගෘහ ඒකකවලට අඛණ්ඩව පිරිසිදු පානීය ජලය සැපයීමේ රජයේ අරමුණට අනුකූලව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ආරක්ෂිත පානීය ජලය සැපයීම වැඩි කිරීම පිණිස නල ජලය ලබා දෙන ප්‍රදේශවල ආවරණය වැඩි කිරීමට ගන්නා ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.** 2020 මුල් භාගය අවසානය වන විට ශ්‍රී ලංකාවේ නල ජල සැපයුම් ආවරණය සියයට 52.1ක් වූ අතර, එය 2019 අවසානය වන විට පැවති සියයට 51.8 සිට සුළු වශයෙන් වර්ධනයක් වාර්තා කර තිබේ. 2019 වසරේ අග වන විට සියයට 91.9ක් වූ පිරිසිදු පානීය ජලය සඳහා වන ප්‍රවේශය 2020 පළමු භාගය වන සිට සියයට 92.2ක් දක්වා ඉහළ ගියේය. කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ඇති වූ පසුබෑම් මධ්‍යයේ, 2019 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ලබා දුන් නව ජල සම්පාදන සම්බන්ධතා 26,902ට සාපේක්ෂව 2020 පළමු භාගය තුළ දී නව සම්බන්ධතා 18,744ක් සැපයීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමත් වී ඇත. තවද, වසරේ මුල් භාගයේ දී නව ජලාපවහන සම්බන්ධතා 5,813ක් ලබා දී ඇත. මේ අතර, 2019 වසරේ මුල් භාගය තුළ දී සියයට 24.9ක් වූ දිවයින පුරා ආදායම් නූපදවන ජල පරිභෝජනයේ ප්‍රතිශතය, 2020 මුල් භාගයේ දී සියයට 25.4ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් තිබේ.

## සමාජ ආරක්ෂණ ජාල වැඩපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම


- **පසුගිය දශක තුන තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවෙහි සැලකිය යුතු අඩු වීමක් දක්නට ලැබුණ ද, කොවිඩ්-19 වසංගතය මගින් සමාජ ආර්ථික වශයෙන් පවතින අවදානම් සහගත තත්ත්ව පිළිබඳව නැවත පෙන්නුම් කෙරිණි.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016ට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය, 2012/13 සමීක්ෂණයේ දී වාර්තා වූ සියයට 6.7 සිට, 2016 දී සියයට 4.1ක් දක්වා අඩු වී තිබේ. 2012/13 සමීක්ෂණ කාලය තුළ දී මිලියන 1.3ක් වූ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව, 2016 දී මිලියන 0.8ක් දක්වා අඩු වී ඇති බව 2016 සමීක්ෂණයේ දී ඇස්තමේන්තු කර ඇත. දරිද්‍රතාව පහත වැටීමේ ප්‍රවණතාවක් පැවතිය ද, පළාත් අතර දරිද්‍රතාවේ සැලකිය යුතු විෂමතා දක්නට ලැබුණු අතර, සියයට 1.7ක් වූ අවම ජනගහන දරිද්‍රතා දර්ශකය බස්නාහිර පළාතෙන් ද, සියයට 7.7ක් වූ ඉහළම ජනගහන දරිද්‍රතා දර්ශකය උතුරු පළාතෙන් ද වාර්තා විය. දිස්ත්‍රික් මට්ටමින් මෙම විෂමතාව වඩාත් පැහැදිලිව දැකගත හැකි වූ අතර, කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 0.9ක් වූ අඩු ම අගයෙහි පැවති අතර, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 18.2ක් වූ ඉහළම අගයෙහි පැවතුණි. ජනගහනයෙන් සැලකිය යුතු පිරිසක් ජීවත් වන්නේ දරිද්‍රතා රේඛාවට මඳක් ඉහළින් වන බව ද අවධානයට යොමු වී තිබේ. මෙම පසුබිම යටතේ, අඩු ආදායම්ලාභී ගෘහ ඒකකවල අඩු වැටුප් ලබන ශ්‍රමිකයන්ට සිය රැකියාවල අවිධිමත් ස්වභාවය අනුව 'ගෙදර සිට වැඩ කිරීමේ' විකල්පවලට ඉඩ ප්‍රස්ථා නොමැති නිසාත්, වැටුප් සහිත නිවාඩු නොලැබෙන නිසාත්, කොවිඩ්-19 වසංගතය පැතිරීම ඔවුන් කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. රැකියාවල නියුතු අයගෙන් සියයට 57.4කට ආසන්න සංඛ්‍යාවක් විධිමත් රැකියා නියුක්තියට අයත් නොවන අතර, කොවිඩ්-19 වසංගතය පැතිරීම වැනි කම්පන හමුවේ එවැනි ජන කොටස්වල සමාජ ආර්ථික සුරක්ෂිතතාව ගැටලු සහගත බවට පත් වේ. එමෙන්ම, මෙය රජයේ දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රයත්න කෙරෙහි බලපෑමක් ඇති කළ හැකිය.

- **කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ, අඩු ආදායම්ලාභී හා අවදානමට ලක් විය හැකි ගෘහ ඒකක ආරක්ෂා කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගෙන ඇති අතර, ආර්ථික හා සමාජ කටයුතු සඳහා සීමා පනවන ලද කාලය තුළ සහ ඉන් පසුව ජීවනෝපායයන් අහිමිවීම හේතුවෙන් ගෘහ ඒකක මත ඇති වූ මූල්‍ය අපහසුතා අවම කිරීමට ද රජය කටයුතු කළේය.** කොවිඩ්-19 වසංගත කාලය තුළ, රජය විසින් අඩු ආදාම්ලාභී ගෘහ ඒකකවල මූල්‍ය අවදානම කඩිනමින් හඳුනාගත් අතර, වැඩි අවදානමක් සහිත ගෘහ ඒකකයකට රුපියල් 5,000 බැගින් දීමනාවක් මාස දෙකක් පුරා ලබා දෙන ලදී. මේ යටතේ, රුපියල් බිලියන 50.1කට ආසන්න මුදලක් බෙදා දී ඇත. මේ අතර, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, මූල්‍ය අංශය සමඟ සමීපව කටයුතු කරමින්,

3

**3.12 රූප සටහන**

**සමෘද්ධි / දිවිනැගුම සුභසාධන වැඩසටහනේ ක්‍රියාකාරිත්වය**





*මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය*

ණය වාරික සහ පොලී මත ණය සහනයක් ලබා දීම, සහනදායී පොලී අනුපාතිකයකට කාරක ප්‍රාග්ධනය ලබා දීම, ණය කාඩ්පත් සඳහා අය කරන පොලී අනුපාත අඩු කිරීම සහ ණය කාඩ්පත්වල ගෙවිය යුතු අවම මාසික වාරික මුදල අඩු කිරීම සඳහා පියවර ගන්නා ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් සහ අඩු බදු වාතාවරණයක් සමඟම එවැනි ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් ගෘහ ඒකක මත ඇති මූල්‍යමය අපහසුතා ඍජු සහ වක්‍ර මාර්ගවලින් අඩු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. අන්ත දරිද්‍රතාවෙන් පෙළෙන ගෘහ ඒකකවල විධිමත් අධ්‍යාපනයක් නොමැති හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) මට්ටමට වඩා අඩු අධ්‍යාපනයක් ලබා ඇති නුපුහුණු ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා 100,000ක් ලබා දීමට රජය විසින් ආරම්භ කරන ලද වැඩපිළිවෙළ තුළින් ද දිළිඳුකම තුරන් කිරීම අරමුණු කෙරේ.

**3.13 රූප සටහන**

**ජනගහන දරිද්‍රතා දර්ශකය**




*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

- අඩු ආදායම්ලාභී සහ අවදානමක් සහිත පුද්ගලයින්ගේ සහ ගෘහ ඒකකවල සමාජ ආර්ථික යහපැවැත්ම ඉහළ නැංවීම සඳහා රජය විසින් 2020 වසරේ මුල් භාගයේ දී විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ මුල් භාගයේ දී සමෘද්ධි සහනාධාර වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් මිලියන 1.8ක් අතර රුපියල් බිලියන 26.4ක මුදලක් බෙදා දී ඇත. තවද, දුෂ්කර කාලවල දී සහ විශේෂ අවස්ථාවල දී අඩු ආදායම්ලාභී පවුල් සඳහා යම් මූල්‍ය සහනයක් සලසා දීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කෙරෙන සමෘද්ධි සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ ප්‍රතිලාභී පවුල් 114,670ක් අතර රුපියල් මිලියන 627ක මුදලක් බෙදා දී තිබේ. මේ අතර, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සුව බොජුන් මධ්‍යස්ථාන හා අලෙවි සැල් වැඩිදියුණු කිරීම සහ කාබනික ආහාර නිෂ්පාදනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම වැනි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, රජය විසින් ගර්භණී සහ කිරි දෙන මව්වරුන් ඉලක්ක කරගත් පෝෂණ දීමනා වැඩසටහන ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා කාලසීමාව සඳහා රුපියල් බිලියන 3.2ක් වෙන් කර ඇති අතර, ඒ හරහා ප්‍රතිලාභීන් 186,554ක් ආවරණය කරමින් 2020 වසරේ මුල් භාගයේ දී රුපියල් බිලියන 2.2ක් වැය කර තිබේ. විශේෂයෙන් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් උදෙසා වූ පෙර පාසල් සහ මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ට උදෑසන ආහාරය සැපයීමේ වැඩසටහන 2020 වසරේ මුල් භාගයේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ළමුන් 72,840ක් මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා ඇති අතර, ඒ සඳහා දරන ලද පිරිවැය රුපියල් මිලියන 66.3කි.

## අපේක්ෂිත වර්ධනයන්

- විදුලිබල සහ වරාය ආශ්‍රිත යටිතල පහසුකම් ව්‍යාපෘති ගණනාවක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඒවා රටේ ඵලදායීතා ශක්‍යතාවයෙහි වැඩිදියුණු කිරීම සඳහා දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020 සැප්තැම්බර් මාසයේ දී මෙගාවොට් 300ක ධාරිතාවයෙන් යුතු දෙවන සංයෝජිත චක්‍රීය ද්‍රවීකාරක ස්වාභාවික වායු බලාගාරය ඉදි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය. රටෙහි විදුලිය සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑමත් සමඟ, විශේෂයෙන්ම අඩු පිරිවැය බලශක්ති ප්‍රභව හරහා විදුලිබල උත්පාදන ධාරිතාව ඉහළ

නැංවීම ඉතා වැදගත් වේ. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ඔවුන්ගේ පස්-අවුරුදු සැලසුමට අනුකූලව, නැගෙනහිර බහලු පර්යන්තය සහ බටහිර බහලු පර්යන්තය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරත වේ. මෙම පර්යන්ත 2025 වසර වන විට පූර්ණ වශයෙන් මෙහෙයුම් සඳහා යෙදවීමට අපේක්ෂා කෙරෙන අතර, ඒවායේ වාර්ෂික අංගන ධාරිතාව අඩි විස්සට සමාන බහලු ඒකක මිලියන 2.4ක් බැගින් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය සංරෝධක පිළිබඳව නිසි සැලකිල්ල දක්වමින් රජය විසින් භෞතික යටිතල පහසුකම් සැපයීමට හා ඒවා වැඩිදියුණු කිරීමට දරනු ලබන ප්‍රයත්න අඛණ්ඩව ගෙන යනු ඇතැයි බලාපොරොත්තු වේ. මෙම ප්‍රවණතාවයන් රටේ ඵලදායී විභවතාවය වැඩි කරනු ඇති අතර, එමගින් දැනට පවතින විෂමතා දුරු කර තිරසාර සහ සර්ව සහභාගිත්ව වර්ධනයක් හා සැමට අත් විඳිය හැකි සෞභාග්‍යයක් නිර්මාණය කරනු ඇති බවට අපේක්ෂිතය. පෞද්ගලික අංශය ද යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සක්‍රීය දායකත්වයක් දරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **කොවිඩ්-19 වසංගතය මගින් ආර්ථිකයේ සියලුම ක්ෂේත්‍ර වෙත, විශේෂයෙන්ම අධ්‍යාපන හා සෞඛ්‍ය අංශ සඳහා, පෙර නොවූ විරූ අවහිරතා නිර්මාණය කර ඇති අතර, එම සේවා ලබා දීමේ දී නව්‍ය සහ නවෝත්පාදන උපක්‍රම සකස් කිරීම සඳහා අවස්ථාවක් ද මෙම අවහිරතා මගින් උදා කර දී ඇත.** වසංගතය මගින් ආර්ථික අර්බුදයක් නිර්මාණය කළ ද, මෙම අර්බුදය මගින් විශේෂයෙන්ම අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ගේ නවෝත්පාදන සඳහා අභිප්‍රේරණයක් ද ලබා දී ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මංගත ප්‍රවේශ, ජනමාධ්‍ය සහ නිවසේ දී කළ හැකි අධ්‍යයන පැකේජ හරහා අධ්‍යාපන සේවා ලබා දීම මෙන්ම, සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ මංගත ක්‍රමවේද ඔස්සේ විශේෂඥ වෛද්‍ය උපදෙස් සැපයීම හා රජයේ රෝහල්වලින් නිරතුරුව සෞඛ්‍ය පහසුකම් ලබන රෝගීන් සඳහා අවශ්‍ය ඖෂධ නිවසටම ලැබීමට සැලැස්වීම යනාදිය මීට ඇතුළත් වේ. පාරිභෝගිකයින්ගේ කාලීන හා වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා සන්නිවේදන සේවා සපයන්නන් විසින් ද අධ්‍යයන හා රැකියා අවශ්‍යතා සඳහා ම වූ විශේෂ වූ දත්ත පැකේජ වැනි නව නිෂ්පාදන කිහිපයක් හඳුන්වා දී ඇත. කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා දිගු කාලයක් පුරා පැවතීමට ඇති හැකියාව සැලකූ කළ, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාවන්ගේ සේවා සපයන ක්‍රමවේදවල වේගවත් වෙනස්වීමක් සිදු වෙතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෙම නව ක්‍රමවේද විධිමත් කිරීමට සහ ඒවා අඛණ්ඩව ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා මෙම නවෝත්පාදන හා කාර්යක්ෂම සේවා සැපයුම් යාන්ත්‍රණ වේගවත්ව ආයතන රාමුවට අන්තර්ගත කිරීම ද අවශ්‍ය වන අතරම, වසංගත කාලය තුළ දී ජනප්‍රිය වූ දුරස්ථව රැකියා කටයුතු කිරීමේ ක්‍රමවේද ඔස්සේ විදේශ විනිමය ඉපයීමට සහ වියදම් ඉතිරි කර ගැනීමට අවස්ථාවක් ලබාගත හැකි ආකාරයට අවශ්‍ය පියවර ගත යුතුය. තවද, මෙම නොසිතූ විරූ වෙනස්කම් සහ ශීඝ්‍ර සංවර්ධනය මගින්, ජනගහනයේ පීඩාවට පත් විය හැකි සහ වරප්‍රසාද අහිමි ජන කොට්ඨාශවලට විෂමාකාර බලපෑම් සිදු නොවන බවට සහතික කිරීම සඳහා, විශේෂයෙන්ම අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශයන්ගේ නව වර්ධනයන්ට සමාන්තරව, සාධාරණත්වය හා සර්ව සහභාගිත්වය කෙරෙහි ද නිසි අවධානය යොමු විය යුතු වේ.

3